සැ. යු.- 2016.02.05 දින පළ වූ අංක 1,953 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,954 - 2016 පෙබරවාරි මස 12 වැනි සිකුරාදා - 2016.02.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 552 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 575 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මාර්තු මස 04 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 පෙබරවාරි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
*රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# අතුරු ව්‍යවස්ථා

## ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2015 නොවැම්බර් මස 26 වැනි දින.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මෙම අතුරු ව්‍යවස්ථාව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන පුද්ගලයන්ගේ අධ්‍යාපනික, සංවර්ධනය, කියවීමේ රුචිකත්වය දියුණු කිරීම, පුද්ගල විනය හා පෞරුෂය වර්ධනය කිරීම, විනෝදාත්මක හා නිර්මාණාත්මක අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ වූ සම්පත් හා සේවා සැපයීම තුළින් මහජන පුස්තකාල සේවාව විධිමත් කර පාලනය කිරීමට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල පහත සඳහන් අංශ හා සේවාවන්ගෙන් සමන්විත වන්නේ ය.

(i) බැහැරදෙන අංශය,
(ii) විමර්ශන අංශය,
(iii) ළමා අංශය,
(iv) වාර සඟරා හා පුවත්පත් අංශය,
(v) විශේෂිත එකතු හා ප්‍රාදේශීය එකතු,
(vi) ප්‍රජා තොරතුරු සේවා,
(vii) ඡායා පිටපත් සේවාව,
(viii) ශ්‍රව්‍ය දෘශ්‍ය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවාව,
(ix) අන්තර්ජාල පහසුකම් සේවාව,
(x) විද්‍යුත් පුස්තකාල සේවාව.

04. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල සඳහා පුස්තකාලයාධිපතිවරයෙකු බැගින් සිටිය යුතු වන අතර, එසේ පත් කරනු ලබන තැනැත්තා මහජන පුස්තකාල සංවිධානය හා කළමනාකාරිත්වය විධිමත්ව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට වගකිව යුතු වන්නේ ය.

05. මහජන පුස්තකාල අධීක්ෂණය හා සාමාන්‍ය පරිපාලනය සඳහා (මෙහි මින්මතු පුස්තකාල කමිටුව යනුවෙන් සඳහන් කරනු ලබන) පුස්තකාල උපදේශක කාරක සභාව වෙත පැවරෙන්නේ ය.

I. මෙම කාරක සභාව ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව පත්කරනු ලැබේ. එහි පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වනු ඇත.

(අ) ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා,
(ආ) ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරුන් අතරින් තෝරාගනු ලබන තුන්දෙනෙකුට නොවැඩි සාමාජිකයින් සංඛ්‍යාවක්,
(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි ජනතාව අදහන ආගම් නියෝජනය වන ආකාරයට එක් එක් ආගම වෙනුවෙන් එක් නියෝජිතයෙකු බැගින්,
(ඈ) ප්‍රාදේශීය සභාව විසින් තෝරාපත් කරගනු ලබන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි විශිෂ්ඨ තැනැත්තන් තුන් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක්,
(ඉ) ප්‍රාදේශීය සභාවේ ලේකම්,
(ඊ) ප්‍රජා සංවර්ධන නිලධාරි,
(උ) ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන පුස්තකාලයේ පුස්තකාලයාධිපති,
(ඌ) බල ප්‍රදේශයේ ප්‍රධාන විදුහලක විදුහල්පතිවරයෙකු,
(එ) බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩලයක නියෝජිතයෙක්.

II. ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා නිල බලයෙන් කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර, කමිටුවේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට පැමිණ සිටි සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගන්නා සාමාජිකයෙකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය. පුස්තකාලයාධිපති කමිටුවේ ලේකම් විය යුතු ය.

III. ප්‍රාදේශීය සභාවේ ලේකම් කැඳවුම්කරු විය යුතු ය.

IV. ගන පූර්ණය සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

V. කවර හෝ රැස්වීමක මූලාසනය දරන සාමාජිකයාට එක් මූලික ඡන්දයක් ද, යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සමාන වුවහොත් තීරක ඡන්දයක් ද ඇත්තේ ය.

06. *සාමාජිකත්වය ලබා ගැනීම.-*

I. පුස්තකාල සේවාවන් අපේක්ෂා කරන සෑම තැනැත්තෙකුම සභාව විසින් කලින් කළ යෝජනා සම්මුතියක් මගින් නියම කරනු ලබන ගාස්තුවක් ගෙවා පුස්තකාලයාධිපති වෙතින් ලබා ගන්නා අයදුම්පතක් මගින් සාමාජිකත්වය ඉල්ලුම් කළ යුතු අතර, එම අයදුම්පත්‍රය මෙහි පහත සඳහන් තැනැත්තෙකු ලවා සහතික කරවා ගත යුතු ය.

(අ) පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි,
(ආ) සාමදාන විනිශ්චයකාරවරයෙක්,
(ඇ) ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරයෙක්,
(ඈ) පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි,
(ඉ) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙක්,
(ඊ) පාසැල් අයදුම්කරුවෙකු නම් ඔහු හෝ ඇය ඉගෙන ගන්නා පාසැලේ විදුහල්පතිවරයා/පන්තිභාර ගුරුවරයා.

II. පුස්තකාල සාමාජිකත්වය ලබා ගැනීම සඳහා පහත සුදුසුකම් තිබිය යුතු ය.

(අ) සාමාන්‍ය සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු හෝ දේපල හිමියෙකු හෝ රැකියාවක් කරන්නකු වීම,
(ආ) ළමා සාමාජිකත්වය සඳහා වයස අවුරුදු පහට වැඩි ප්‍රදේශයේ පාසැලක හෝ පිරිවෙනක ඉගෙනුම ලබන්නෙකු වීම.

III. සාමාජික ගාස්තු.-

(අ) වාර්ෂික සාමාජික ගාස්තුව සාමාන්‍ය සාමාජිකයෙකු සඳහා රු. 100.00 කි. වසරකට වරක් රු. 25/- ක් ගෙවා සාමාජිකත්වය අළුත් කරවා ගත යුතු ය. වාර්ෂික සාමාජික ගාස්තුව වරින්වර ප්‍රාදේශීය සභා රැස්වීමේ දී තීරණය කරන ගාස්තුවක් විය යුතු ය.

(ආ) ළමා සාමාජිකත්වය සඳහා සාමාජික ගාස්තුව රු. 50.00 කි. වසරකට වරක් රු. 25/-ක් ගෙවා සාමාජිකත්වය අලුත් කරවා ගත යුතු ය. (කමිටුවේ නිර්දේශය මත මහා සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් යෝජනා කරන ලද යම් මුදලක් සාමාජික ගාස්තු වශයෙන් හා සාමාජිකත්වය අලුත්කිරීමේ ගාස්තු වශයෙන් ගෙවීමට යටත් වන්නේ ය.)

IV. ඇපකරුවන්.-

(අ) සාමාන්‍ය සාමාජිකයින් සඳහා ඇපකරුවන් වශයෙන් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට වරිපනම් බදු ගෙවන ස්ථිර පදිංචිකරුවෙකු ඇපකරුවෙකු වශයෙන් අත්සන් කළ යුතු ය.
(ආ) ළමා සාමාජිකයින් සඳහා ඇපකරුවන් වශයෙන් ඔවුන්ගේ මව/පියා/භාරකරු අත්සන් කළ යුතු ය.
(ඇ) බල ප්‍රදේශයේ රැකියාවක නියුතු අයෙකු සඳහා ඇපකරුවන් වශයෙන් බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි වරිපනම් බදු ගෙවන පදිංචිකරුවෙකු ඇපකරුවෙකු විය යුතු ය.

07. බැහැරදෙන පුස්තකාලයේ සාමාජිකයෙකුට බලපත්‍ර දෙකක් නිකුත් කරන අතර සාමාජිකයා විසින් රැගෙන යන සෑම පොතක් සඳහාම සාමාජිකයා වගකිව යුතු ය.

08. පුස්තකාල සාමාජිකයෙකු විසින් බැහැරට රැගෙන යන පොතක් එය ලබාගන්නා දින සිට දින 14ක කාලයක් ඇතුළත පුස්තකාලයාධිපතිවරයාට ආපසු බාරදිය යුතු ය.

09. අතුරු ව්‍යවස්ථාවේ 07 වන ව්‍යවස්ථාවේ සඳහන් පරිදි දින 14ක කාලසීමාවක් ඇතුළත යම් පොතක් පුස්තකාලයාධිපතිවරයාට ආපසු බාර දී යම් සාමාජිකයෙකු විසින් බැහැර හරිනු ලබන අවස්ථාවක දී එම පොත ආපසු භාරදිය යුතු දිනය ඉක්මවා යන එක් දිනයක් වෙනුවෙන් රු. 1.00 බැගින් වන ප්‍රමාද ගාස්තුවක් හෝ කමිටුවේ නිර්දේශය මත මහා සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් යෝජනා කරන ලද යම් මුදලක් ප්‍රමාද ගාස්තු වශයෙන් ගෙවීමට යටත් වන්නේ ය.

10. අතුරු ව්‍යවස්ථාවේ 08 වන ඡේදයේ සඳහන් පරිදි බැහැරට රැගෙන යන පොතක් දන 14ක කාලසීමාව ඉකුත් වී දින 07කට පසු සාමාජිකයාට සිහි කැඳවීම් ලිපි 01ක් ද, ඇපකරුවෙකුට එක් අවස්ථාවක් බැගින් දැනුම් දිය යුතු අතර ඒ සඳහා වැය වන ගාස්තු අදාළ සාමාජිකයාගෙන් හෝ ඇපකරුගෙන් අයකර ගත යුතු වන්නේ ය. එසේ දැන්වීමක් භාරදීමෙන් පසුව ද, එම පොත් භාරදීම පැහැර හරින අවස්ථාවන්හි දී එම පොත නැති වූ පොතක් සේ සලකනු ලැබේ.

11. එසේ පොතක් නැතිවූවා සේ සලකන අවස්ථාවක එම පොතේ වටිනාකම සහ අමතර 25%ක සේවා ගාස්තුවක් ද, අතුරු ව්‍යවස්ථාවේ 08 ඡේදයේ සඳහන් දඩ මුදල් ද අදාළ සාමාජිකයා හෝ ඇපකරු විසින් ගෙවිය යුතු ය. සාමාජිකයා විසින් බැහැරට රැගෙන යන පොතකට හානි කිරීම හෝ කවර ආකාරයෙන් එය විරූප කිරීම නොකළ යුතු ය.

12. බැහැරට රැගෙන යාමට අපේක්ෂා කරන පොතකට සිදු වී ඇති හානියක් හෝ විරූප කිරීමක් පිළිබඳව පුස්තකාලයාධිපතිවරයාට දැනුම් දීම යම් සාමාජිකයෙකු විසින් පැහැර හැරි අවස්ථාවක එම පොත සාමාජිකයාට හානියක් හෝ විරූප කිරීමකින් තොරව නිකුත් කරන ලද සේ සැලකිය යුතු ය.

13. සාමාජිකයා විසින් ආපසු භාර දෙන ලද පොතක් නැවතත් නිකුත් කිරීමට නුසුදුසු වන තරමට හානිකර හෝ විරූප කර ඇති බවට පුස්තකාලයාධිපති සෑහීමට පත්වන්නා වූ අවස්ථාවක, එම පොත නැවත සපයා ගැනීමේ වියදම දැරීමට අදාළ සාමාජිකයා බැඳී සිටින්නේ ය. එම පොත නැවත සපයා ගැනීමෙන් පසුව ''හානි වූ පොතක් ලෙස විකුණන ලදී.'' යනුවෙන් මුද්‍රා තබා එය සාමාජිකයන්ට දෙනු ලැබිය යුතු ය.

14. පුස්තකාලයෙන් ලබාගත් පොත් කිසිම සාමාජිකයෙකු විසින් අන්සතු කිරීමක් නොකළ යුතු ය.

(i) ඉහත 13 අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධි විධාන උල්ලංඝනය කරන කවර හෝ සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි වන්නේ ය.

(ii) ආසාදන හෝ ස්පර්ශ රෝගයකින් පෙලෙන යම් තැනැත්තෙකු විසින් පාවිච්චි කළ බව තමා දන්නා කිසිම පොතක් කිසිම සාමාජිකයෙකු විසින් පුස්තකාලයට ආපසු භාර නොදිය යුතු ය.

(iii) බැහැරව රැගෙන යන ලද පොතක් ආසාදන හෝ ස්පර්ශ රෝගයකින් පෙලෙන තැනැත්තෙකු විසින් පාවිච්චි කර ඇති විට එම පොත විනාශ කළ යුතු අතර, එය නැවත සපයා ගැනීමේ වියදම එම සාමාජිකයා විසින් පුස්තකාලයාධිපතිට ගෙවිය යුතු ය.

(iv) බැහැරදෙන පුස්තකාලයේ සාමාජිකයෙකු හට නිකුත් කරන ලද කාඩ්පතක් ඔහු අතින් අස්ථානගත වූ අවස්ථාවක එම නැතිවීම ඔහු විසින් පුස්තකාලයාධිපතිවරයාට ලිපියක් මගින් දැනුම් දීම කළ යුතු ය. පුස්තකාලයෙන් පොතක් බැහැරට රැගෙන ගොස් නොමැති බවට පුස්තකාලයාධිපතිවරයා සෑහීමකට පත් වුවහොත් එම සාමාජිකයාට අනු සාමාජික කාඩ්පතක් නිකුත් කළ හැකි ය.

(v) කාඩ්පතක් අස්ථානගත වී ඇති බවට දැනුම් දුන් දිනයේ සිට දින 14ක කාලයක් ඉක්ම වී ඇත්නම් මිස පුස්තකාලයාධිපතිවරයා විසින් අනු පිටපතක් නිකුත් නොකළ යුතු යි.

15. කිසියම් පොතක් ලබාදිය යුත්තේ කවර සාමාජිකයාට ද, යන්න පිළිබඳව මතභේදයක් සාමාජිකයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් අතර උද්ගත වූ විටක එම මතභේදය පුස්තකාලයාධිපති විසින් විසඳිය යුතු ය.

16. බැහැර දෙන පොතක් සාමාජිකයෙකු විසින් ඉල්ලා සිටි විටක එය නිකුත් කළ යුතු අතර ඒ වන විටත් එකී පොත නිකුත් කර තිබුනේ නම් ඉල්ලුම්කරුගේ හෝ ඉල්ලුම්කරුවන්ගේ නම් පොරොත්තු ලේඛනයක සටහන් කරගෙන එම පොත පුස්තකාලයට ලැබුණු පසු ඒ තැනැත්තාට ලබා දීමට පුස්තකාලයාධිපතිවරයා ක්‍රියා කළ යුතු ය.

17. බැහැර දෙන පුස්තකාලය ඉරිද දින හා ප්‍රසිද්ධ නිවාඩු දින හා යටත් පිරිසෙන් සාමාජිකයින්ට දවස් 07ක දැනුම් දීමකින් පසු තොග ගණන් ගැනීම සඳහා කාරක සභාව විසින් නියම කරන යම් දිනයන්හි හැර දිනපතා පෙ. ව. 8.30 සිට ප. ව. 4.15 දක්වා අතර කාලය තුළ විවෘතව තබනු ලැබේ. නමුත් කාරක සභා නිර්දේශය මත විවෘතව තබන දිනයන් හා වේලාවන් වෙනස් කරනු ලැබිය හැකි ය.

18. *විමර්ශන අංශය.-*

(i) පුස්තකාලයාධිපතිවරයාගේ අවසරය ඇතිව විමර්ශන අංශයේ තබා ඇති ලේඛනයේ ආකෘති පත්‍රයේ අත්සන් තබා විමර්ශන ග්‍රන්ථ පරිශීලනය කළ යුතු ය.

(ii) කියවීම සඳහා තමන් වෙත නිකුත් කරන ලද කිසිම පුස්තකාල පොතක්, සඟරාවක් හෝ වෙනත් යම් දෙයක් විමර්ශන අංශයෙන් පිටතට රැගෙන නොයා යුතු ය. එසේ වුව ද, ඡායා පිටපත් සේවාවක් ක්‍රියාත්මක වන්නේ නම් පුස්තකාලයාධිපතිවරයාගේ අනුමැතිය හා භාරකාරත්වය යටතේ එම ප්‍රකාශනයේ අවශ්‍ය පිටු නියමිත ගාස්තු ගෙවා ඡායා පිටපත් ලබා ගැනීමට ඉල්ලා සිටින යම් තැනැත්තෙකුට ඉඩ කඩ සැලැස්විය යුතු ය.

(iii) උපදේශක කාරක සභාවේ නිර්දේශය මත සභාව කලින් කල යෝජනා සම්මුතියක් මගින් නියම කරනු ලබන යම් මුදලක් මෙම ඡායා පිටපත් සේවාව සඳහා අයකර ගත හැක.

19. *කියවීම් ශාලාව.-*

(i) විවෘත කර තබන සෑම දිනකම පුස්තකාල කියවීම් ශාලාව පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා හෝ කාරක සභාවේ නිර්දේශය මත මහා සභාව විසින් තීරණය කරනු ලබන දිනයන් හා වේලාවන් තුළ විවෘත කර තබනු ලැබේ. කියවීම් ශාලාව පරිශීලනය කරන ඕනෑම තැනැත්තෙකුට හැකි අතර ඒ සඳහා කියවීම් ශාලාවේ තබා ඇති ලේඛනයේ නම සහ පැමිණි වේලාව සටහන් කර අත්සන් තබා කියවීම් ශාලාවේ සේවාවන් ප්‍රයෝජනයට ගත යුතු ය.

(ii) කියවීම් ශාලාවේ තබා ඇති හෝ කියවීම් ශාලාවට අයත් කිසිම පුවත්පතක් හෝ වාර සඟරාවක් හෝ සිතියමක් හෝ වෙනත් පුස්තකාල ද්‍රව්‍යයකට හානියක් නොකළ යුතු යි.

20. *ඡායා පිටපත් සේවය.-*

(i) ඡායා පිටපත් සේවාවක් ක්‍රියාත්මක වන්නේ නම් පුස්තකාලයාධිපතිවරයාගේ අනුමැතිය හා භාරකාරත්වය යටතේ එම ප්‍රකාශනයේ අවශ්‍ය පිටු 03ක් පමණක් නොමිලයේ ඡායා පිටපත් ලබා ගැනීමට ඉල්ලා සිටින යම් තැනැත්තෙකුට ඉඩකඩ සැලැස්විය යුතු ය.

(iii) උපදේශක කාරක සභාවේ නිර්දේශය මත සභාව කලින් කල යෝජනා සම්මුතියක් මගින් නියම කරනු ලබන යම් මුදලක් මෙම ඡායා පිටපත් සේවාව සඳහා අයකර ගත හැක.

21. *ශ්‍රව්‍ය දෘශ්‍ය, තොරතුරු හා සංනිවේදන තාක්ෂණ අංශය.-*

(1) අන්තර්ජාල පහසුකම් :

(i) පුස්තකාලය මගින් ලබාදෙන විද්‍යුත් පුස්තකාලය සඳහා වූ අයදුම්පත්‍රයක් සම්පූර්ණ කර සාමාජිකත්වය ලබාගෙන එක් තැනැත්තෙකුට කැමති කාලසීමාවක් තුළ අන්තර්ජාල සේවාව ලබා ගත හැක.

(ii) අන්තර්ජාල පහසුකම් සඳහා ගාස්තු වශයෙන් පැයකට රු. 40.00ක මුදලක් අය කර ගත යුතු ය. එසේ වුව ද, කාරක සභාවේ නිර්දේශය පරිදි කලින් කල යෝජනා සම්මුතියක් මගින් ගාස්තු සංශෝධනය කිරීමේ හැකියාව සභාව සතු වන්නේ ය.

(2) විද්‍යුත් පුස්තකාල සේවාව :

(i) විද්‍යුත් පුස්තකාලය සඳහා ඇති සාමාජික අයදුම්පත්‍රයක් රු. 10ක් වන අතර, මාසයකට වරක් රු. 100 ක් ගෙවා සාමාජිකත්වය අලුත්කරවා ගත යුතු ය. එසේ වුව ද, කාරක සභාවේ නිර්දේශය පරිදි කලින් කල යෝජනා සම්මුතියක් මගින් ගාස්තු සංශෝධනය කිරීමේ හැකියාව සභාව සතු වන්නේ ය.

(ii) පුස්තකාලය විවෘතව පවතින දිනයන්හි පමණක් එක් සාමාජිකයෙකුට පැය 02ක කාලයක් විද්‍යුත් පුස්තකාල සේවාව සඳහා වෙන්කර ගත හැක.

22. කිසියම් තැනැත්තෙකු -

(i) මහජන පුස්තකාල පරිශ්‍රය තුළ හෝ ඒ අවට නොහික්මුණු ආකාරයෙන් හැසිරීම එවැනි හිරිහැරයක් ඇති කිරීම නොකළ යුතු ය.

(ii) පුස්තකාලය හෝ ඒ අවට ප්‍රාදේශීය සභාවේ යම් ගොඩනැගිල්ලකට, කොටසකට හෝ දේපලකට අලාභයක් කිරීම හෝ යම් ආකාරයකින් ඒවා විරූප කිරීම නොකළ යුතු ය.

(iii) පුස්තකාලය විවෘතව තබන වේලාවෙන් පසු පුස්තකාල පරිශ්‍රය තුළ රැඳී සිටීම හෝ නිකරුනේ හැසිරීම නොකළ යුතු ය.

(iv) පුස්තකාල පරිශ්‍රය තුළ මත්පැන් පානය, දුම්පානය හෝ කෙල ගැසීම නොකළ යුතු ය.

(v) පුස්තකාල පරිශ්‍රය තුළ දදු කැටවලින් හෝ කාඩ් කුට්ටම්වලින් සූදුවේ නොයෙදිය යුතු ය.

(vi) පුස්තුකාල පරිශ්‍රය තුළ සෝෂා කිරීමෙන්, ගී ගැයීමෙන් හෝ වෙනත් ශබ්ද නැගීමෙන්, එම පුස්තකාලය පාවිච්චි කරන්නන්ට බාධා නොකළ යුතු ය.

(vii) අපිරිසිදු තත්ත්වයෙන් මහජන පුස්තකාලයට ඇතුල් නොවිය යුතු යි.

(viii) පුස්තකාල පරිශ්‍රය තුළට කිසිදු සත්වයෙක් රැගෙන නොයා යුතු යි.

(ix) පුස්තකාල පරිශ්‍රය තුළ නිදගැනීම හෝ ආහාරයක් ගැනීම නොකළ යුතු ය.

(x) පුස්තකාලයාධිපතිවරයාට හෝ පුස්තකාලයාධිපතිවරයාගේ නියමය යටතේ ක්‍රියාකරන වෙනත් තැනැත්තෙකුට මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමෙහි ලා බාධා නොකළ යුතු ය.

(xi) යම් ආසාදන ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙලෙන හෝ මෑතක දී පෙලුන නැතහොත් එම රෝගයකින් පෙලෙන තැනැත්තෙකුට මෑතක දී උපස්ථානයේ යෙදුන අයෙකු රෝග බෝවීමේ කාලය ඉකුත්වන තෙක් මෙම මහජන පුස්තකාල පරිශ්‍රයට ඇතුලත් නොවිය යුතු ය.

(xii) පුස්තකාලය තුළ ජංගම දුරකථන පරිහරණයෙන් වැලකිය යුතු ය. පුස්තකාලය තුළට ජංගම දුරකථන රැගෙන එන්නේ නම් ක්‍රියාවිරහිත කර තබා ගැනීමට කටයුතු කළ යුතු ය.

23. බැහැරට දෙන අංශය හැර විමර්ශන අංශයේ හා අනෙකුත් අංශ පරිහරණය සඳහා සභාව විසින් තීරණය කර ඇති මෙම අතුරු ව්‍යවස්ථාවේ 2 වන උපලේඛනයේ ගාස්තුවක් පුස්තකාලයේ සාමාජිකයන් නොවන අයගෙන් අයකල හැකි ය. මෙම ගාස්තු කාරක සභාවේ නිර්දේශ මත වරින් වර එළඹෙන සභා සම්මුතීන් පරිදි සංශෝධනය කළ හැකි ය.

24. *වාර්ෂික තොග සමීක්ෂණය.-*

(i) පුස්තකාලය සඳහා සෑම වර්ෂයක් පාසාම වාර්ෂික තොග සමීක්ෂණයන් පැවැත්වීම ප්‍රාදේශීය සභා ලේකම්වරයාගේ වගකීම වේ.

(ii) වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(iii) සභාව විසින් සම්මත කරන ලද නිර්දේශ සභා සම්මත දිනයෙන් මාස දෙකක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතු ය.

25. මෙම අතුරු ව්‍යවස්ථාවේ විධි විධාන උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කරණු ලැබූවිට ද උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තිය සඳහන් දණ්ඩනයන්ට යටත් විය යුතු ය.

26. *අර්ථ නිරූපනය.-*

(i) පුස්තකාලයාධිපති යන යෙදුමන් පුස්තකාලය භාරව සිටීමට ප්‍රාදේශීය සභා මගින් පත්කරනු ලබන තැනැත්තෙකු අදහස් වන අතර ඔහුගේ සහයකයන් ද ඊට ඇතුළත් වේ.

(ii) ප්‍රජා සංවර්ධන නිලධාරීන් යන්නෙන් පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන කටයුතු පිණිස පත් කරනු ලැබ ඇති නිලධාරියා යන්න අදහස් වේ.

(iii) සභාව යන්නෙන් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව යන්න අදහස් කෙරේ.

(iv) කාරක සභාව යන්නෙන් පුස්තකාල උපදේශක කාරක සභාව වේ.

(v) විශිෂ්ඨ තැනැත්තෙක් යන්නෙන් ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන කීර්තිමත් කැපී පෙනෙන සමාජ මෙහෙවරක් ඉටු කරනු ලබන උගත්, බුද්ධිමත් පුද්ගලයන් අදහස් කෙරේ.

27. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල/දෙමල/ඉංග්‍රීසි භාෂා පිටපත් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල පිටපත බල පැවැත් වේ.

02-303

---

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,<br>
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,<br>
සබරගමුව පළාත.

2015 නොවැම්බර් මස 26 වැනි දින.

### සුසාන භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු සුසානභූමිවල මෘතදේහ මිහිදන් කිරීම, තැන්පත් කිරීම, විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සතු කිසියම් සුසාන භූමියක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීමට අදහස් කරන යම් තැනැත්තෙකු මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල පළමුවන උපලේඛනයේ දක්වෙන ආකෘතියට සාරානුකූලව පිළියෙල කළ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

3. මියගිය යම් තැනැත්තෙකුගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ මහෙස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයකු විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබූ, එකී පරීක්ෂණය අවසානයේ මෘත දේහය ආදාහනය කිරීමට එකී මහෙස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා අවසරයක් දී ඇත්තේ නම් මිස, එකී මෘත දේහය ආදාහනය කිරීමට භාර ගැනීම හෝ ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම හෝ රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතු ය.

4. 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන යම් තැනැත්තෙකු වෙත රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සතු කිසියම් සුසාන භූමියක් පරිහරණය කිරීම සඳහා අවසර පත්‍රයක් නිකුත් කිරීමේ දී මෙහි පහත දක්වෙන කොන්දේසි සම්පූර්ණ කර ඇත්තේ නම් මිස සභාපතිවරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කිරීම නොකළ යුතු ය.

(අ) සුසාන භූමි ප්‍රයෝජනයට ගැනීමට අවසර පත්‍රයක් ඉල්ලීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයට ලැබුණු අනුපිළිවෙල අනුව ලේඛන ගත කරනු ලබන අතර භූමිදාන කිරීම හා තැන්පත් කිරීම පිළිබඳව සලකා බැලීම සිදු කරනු ලැබිය යුතු ය.

(ආ) මෙහි දෙවන උපලේඛනයේ සඳහන් ආදර්ශ ගාස්තු චක්‍රයට අනුව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයට සුසාන භූමි වෙන් කිරීමේ ගාස්තුව සහ තැන්පත් මුදල් ගෙවීමෙන් අනතුරුව පමණක් අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

5. පරිහරණය කිරීම සඳහා සුසාන භූමියක් වෙන් කර ගැනීමට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම, එකී වෙන් කිරීම අපේක්ෂා කරන දිනයට අවම වශයෙන් පැය 24කට පෙර සිදු කළ යුතු ය. කවර හෝ තැනැත්තෙකු විසින් කෙරෙන ඉල්ලීම සුසාන භූමිය වෙන් කර ගැනීමට අවශ්‍ය වන දිනට, දින දෙකකට පෙර ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ හැකි අතර එකී ඉල්ලීමට අනුව කරනු ලබන වෙන් කිරීම 12 වන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව විය යුතු ය.

6. වෙන් කිරීම අවලංගු කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක වෙන්කර ගැනීම අවලංගු කළ ද, වෙන්කර ගැනීම වෙනුවෙන් තැන්පත් කර තිබූ මුදල් ආපසු ලබාදීම නීත්‍යානුකූල නොවන්නේ ය.

7. කිසියම් තැනැත්තෙකු විසින් වෙන්කර ගනු ලැබූ සුසාන භූමියක් වෙන්කර ගත් කාර්යයට හැර වෙනත් කාර්යයකට යොදා ගැනීම නොකළ යුතු ය.

8. සුසාන භූමියක් වෙන් කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍රයක් කවර හෝ හේතුවක් මත වෙනත් තැනැත්තෙකුට පැවරීම නොකළ යුතු ය.

9. කවර හෝ තැනැත්තෙකු විසින් සුසාන භූමියක් වෙන්කර ගැනීම සඳහා කෙරෙන ඉල්ලීමකට ඉඩ නොදෙන අවස්ථාවක දී එසේ ඉඩ නොදීමට හේතුවන කරුණු සඳහන් කරමින් ඒ බව ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනයේම එකී ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දීම සභාපතිවරයාගේ කාර්යය වන්නේ ය.

10. සුසාන භූමියක් භූමාදනයක් හෝ තැන්පත් කිරීමක් සඳහා වෙන්කර ගත් දිනය වෙනස් කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඉල්ලුම්කරු විසින් ඒ පිළිබඳව ලිඛිතව හෝ භූමිදාන කිරීම හෝ තැන්පත් කිරීම වෙනස් කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඉල්ලුම්කරු විසින් ඒ පිළිබඳව ලිඛිතව සභාපතිවරයා වෙත ඉල්ලීමක් කළ හැකි ය. එකී ඉල්ලීම අනුව වෙන්කළ දිනය සංශෝධනය කිරීම 2 වන 3 වන අතුරු ව්‍යවස්ථාවල නියමයන්ට යටත්ව සිදුවිය යුතු ය.

11. සභාව සතු එක් සුසාන භූමියක එක දිනක දී ඕනෑම සංඛ්‍යාවක් මෘත දේහ භූමදාන හෝ තැන්පත් කළ හැකි ය.

12. සභාව සතු සුසාන භූමියක් භූමිදානයක් හෝ තැන්පත් කිරීමක් සිදු කිරීමෙන් අනතුරුව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ තැන්පත් කරනු ලැබූ තැන්පත් මුදලෙන්,

(අ) සුසාන භූමියට හෝ එහි යම් කොටසකට හෝ සිදු වී ඇති යම් අලාභයක් වේ නම් අලාභයේ වටිනාකම, සහ

(ආ) සුසාන භූමිය වෙන්කර ගනු ලැබූ කාල සීමාවට වඩා වැඩිපුර යොදා ගනු ලැබූ කාලය වෙනුවෙන් අයකර ගත යුතු ගාස්තුව,

අඩුකර ගැනීමෙන් අනතුරුව ඉතිරිවන යම් මුදලක් පමණක් ඉල්ලුම්කරුට ආපසු ගෙවනු ලැබිය හැකි ය.

13. කවර හෝ තැනැත්තෙකු විසින් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සතු කිසියම් සුසාන භූමියකට හානි පැමිණවීම හෝ එසේ හානි වීමට සැලැස්වීම නොකළ යුතු අතර, සුසාන භූමිය තුළට ගවයන්, ඌරන්, අශ්වයන්, පෝනියන්, කොටළුවන්, බල්ලන් ඇතුල් කිරීම නොකළ යුතු ය. එසේම රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් ලබාගත් අවසරයක් නොමැතිව කිසිදු වාහනයක් කවර හෝ සුසාන භූමියකට ඇතුල් කිරීම නොකළ යුතු ය.

14. රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව සතු ඕනෑම රජයේ රෝහලකින් ලබා දෙන්නා වූ අයිතිකරුවෙකු හෝ භාරකරුවකු නොමැති මෘත දේහයක් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සතු සුසාන භූමියක සභාව සතු වියදමින් භූමිදාන කටයුතු සිදු කළ හැකි ය.

15. රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ දරිද්‍රතාවයෙන් පෙළෙන ඕනෑම පුද්ගලයකුගේ මෘත දේහයක් රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් මඟින් ඉදිරිපත් කරනු ලබන දරිද්‍රතාවය තහවුරු කරන ලිපි පදනම් කර ගනිමින් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සතු ඕනෑම සුසාන භූමියක කිසියම් හෝ මුදලක් අය කිරීමෙන් තොරව මිහිදන් කිරීම කළ හැකි ය.

16. (අ) මෘත ශරීරයක් භූමිදනය කිරීමට, තැන්පත් කිරීමට, අයකරන ගාස්තු රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මතයක් මඟින් කලින් කල සංශෝධනය කළ හැකි ය.

(ආ) ඉහත (අ) ඡේදය යටතේ පනවනු ලබන හෝ කලින් කළ සංශෝධනය කරන ගාස්තු ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, සුසාන භූමිය වෙන් කරවා ගැනීමට අයදුම්පත් භාර ගන්නා ස්ථානයේ සහ සුසාන භූමියේ මෘත ශරීර තැන්පත් කර තබනු ලබන ස්ථානයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම කළ යුතු ය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුලත් ඕනෑම වගන්තියක් උල්ලංඝණය කිරීම හෝ නොකර හැරීම වරදක් වන අතර, කිසියම් තැනැත්තෙකු නිසි අධීක්ෂණ බලය සහිත අධිකරණයකින් වරදට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තිය අනුව නියම කර ඇති දඩයකින් ද, වරදක් කරනු ලැබීමෙන් පසු එම වරද දිගින් දිගටම කරනු ලබයි නම්, එකී කඩකිරීම් කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් කිරීමෙන් පසුව ද, එකී වරද තවදුරටත් කරගෙන යනු ලබන සෑම දිනයක් සඳහාම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 122 (2) වන වගන්තිය අනුව නියම කර ඇති අතිරේක දඩයකට යටත් විය යුතු ය.

18. මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන යම් ගැටළුවක දී සභාපතිවරයාගේ තීරණය අවසන් තීරණය වන්නේ ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාවේ කිසියම් ව්‍යවස්ථාවක අර්ථ සම්බන්ධයෙන් අනනුකූලතාවයක් ඇතිවුවහොත් මෙහි සිංහල පිටපත සෑම අවස්ථාවක දී ම බලාත්මක විය යුතු ය.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ කටයුතු සඳහා ''ප්‍රාදේශීය සභාව'' යන්නෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව ද, ''සභාපතිවරයා'' යන්නෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සභාපතිවරයා ද, ''ලේකම්'' යන්නෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ද, ''බලය පවරන ලද නිලධාරීන්'' යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරන ලද රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකු ද, ''ග්‍රාම නිලධාරියෙකු'' යන්නෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ග්‍රාම නිලධාරියෙකු ද, පොලිස් නිලධාරියෙකු යන්නෙන් පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරියෙකු ද අදහස් වෙයි.

**පළමුවන උපලේඛනය**

*රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ............................පොදු සුසාන භූමිය පරිහරණය සඳහා අවසර ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය*

01. ඉල්ලුම්කරුගේ නම :..........................................................................................

ලිපිනය :..........................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................

02. මියගිය අයගේ සම්පූර්ණ නම :..........................................................................................

03. උපන් දිනය :........................................................ වයස : අවු. ........................ මාස...................... දින.........................

04 ස්ථිර ලිපිනය :..........................................................................................

05. ග්‍රාමසේවා නිලධාරී වසම :..........................................................................................

06. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධතාවය :..........................................................................................

07. මරණ සහතිකයේ ලි. ප. අංකය හා දිනය :..........................................................................................

08. මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්ගේ නම හා කොට්ඨාසය :..........................................................................................

09. මරණයට හේතුව :..........................................................................................

10. භූමිදනය කිරීම/තැන්පත් කිරීමට ඉල්ලා සිටින දිනය හා වේලාව :..........................................................................................

(i) දිනය :.................................................................................

(ii) වේලාව :.................................................................................

ඉහත සඳහන්කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙම ඉල්ලීමට අනුව අදාල සුසාන භූමිය වෙන්කර දෙනු ලැබුවහොත් එම සුසාන භූමියේ ගොඩනැගිලිවලට, සෙසු ඉදිකිරීම්වලට හා ගහකොළවලට කිසියම් හානියක් වුවහොත් එහි අලාභය තැන්පත් මුදලින් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් අයකර ගනු ලැබීමට එකඟ වන අතර, එහි තැන්පත් මුදල් ඒ අය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන විට තව දුරටත් අවශ්‍ය වන මුදල් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවීමට ද එකඟ වෙමි. එසේම සුසාන භූමිවල මෘත දේහ මිහිදන් කිරීම, තැන්පත් කිරීම, විධිමත් කිරීම, පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධි විධාන පිළිපැදීමට ද එකඟ වෙමි.

.................................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :..........................................

දෙවන උපලේඛනය

*4 වන ඡේදයේ 'ආ' උපලේඛනය*

*සුසාන භූමිය පරිහරණය කිරීමට අයකරන ගාස්තු චක්‍රය*

| *අනු. අංකය* | *සුසාන භූමියේ නම* | *ගාස්තුව භූමිදන කිරීම රු. ශත* | *ආරක්ෂිත ඇප තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|
| 01. | මීපිටියඕවිට (යටන්වල සුසාන භූමිය) | 25 0 | 100 0 |
| 02. | වලව්වත්ත නගෝඕවිට ඉහළ කැල්ල (කරව්දෙනිය සුසාන භූමිය) | 25 0 | 100 0 |
| 03. | මැදගොඩ සුසාන භූමිය | 25 0 | 100 0 |
| 04. | ගැටමුරුත සුසාන භූමිය | 25 0 | 100 0 |
| 05. | ගෝනගල-හාලිඇලගල සුසාන භූමිය | 25 0 | 100 0 |
| 06. | පෙතංගොඩ සුසාන භූමිය | 25 0 | 100 0 |
| 07. | ඇරැපොලමුල්ල සුසාන භූමිය | 25 0 | 100 0 |
| 08. | දන්නොරුව සුසාන භූමිය | 25 0 | 100 0 |
| 09. | බටුවිට සුසාන භූමිය | 25 0 | 100 0 |
| 10. | දළුවලාන සුසාන භූමිය | 25 0 | 100 0 |
| 11. | පුරන්පොත්ත සුසාන භූමිය | 25 0 | 100 0 |
| 12. | ඉඳුරාන පොදු සුසාන භූමිය | 25 0 | 100 0 |
| 13. | වහකුල පොදු සුසාන භූමිය | 25 0 | 100 0 |
| 14. | බංගලිවත්ත පොදු සුසාන භූමිය | 25 0 | 100 0 |
| 15. | නිවුන්හැල්ල විහාරකන්ද පොදු සුසාන භූමිය | 25 0 | 100 0 |

02-301

---

**මාවනැල්ල ප්‍රාදේශීය සභාව**

*අතුරු ව්‍යවස්ථා*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ මාවනැල්ල් ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2015 නොවැම්බර් මස 26 වැනි දින.

**"ආදාහනාගාරය පවත්වාගෙන යාම, විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

මාවනැල්ල ප්‍රාදේශීය සභාව

1. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියෙන් සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව මෙම අතුරු ව්‍යවස්ථාව මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය පවත්වාගෙන යාම විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. *(අ)* සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් නොමැතිව මාවනැල්ල ප්‍රාදේශීය සභාවට අයත් ආදහනාගාරයේ කවර හෝ මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතු ය.

*(ආ)* මියගිය තැනැත්තෙකුගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන නඩු විධාන සංග්‍රහ පනත යටතේ මහෙස්ත්‍රාත්වරයෙකු හෝ මරණ පරීක්ෂකවරයකු විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබ, එකී පරීක්ෂණය අවසානයේ මෘත දේහය ආදාහනය කිරීමට එකී

මහෙස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා අවසරයක් දී ඇත්තේ නම් මිස, එකී මෘත දේහය ආදාහනය කිරීමට භාර ගැනීම හෝ ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම හෝ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතු ය.

3. (අ) මෘත ශරීරයක් ආදාහනය කිරීමට අයකරන ගාස්තු මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මතයක් මගින් නියම කරනු ලැබිය හැකි අතර එවැනිම යෝජනා සම්මතයක් මගින් එකී ගාස්තු කලින් කල සංශෝධනය කළ හැකි ය.

(ආ) ඉහත (අ) ඡේදය යටතේ පනවනු ලබන හෝ කලින් කල සංශෝධනය කරන ගාස්තු ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ආදාහනාගාරය වෙන් කරවා ගැනීමට අයදුම්පත් භාර ගන්නා ස්ථානයේ සහ ආදාහනාගාරයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කළ යුතු ය.

(ඇ) මෘත ශරීරයක් ආදාහනය කිරීමට අයකරන ගාස්තු මෙහි පළමුවැනි උපලේඛනයේ දැක්වෙන වර්ගීකරණය යටතේ පනවනු ලැබිය හැකි ය.

(ඉ) සභාවේ සේවය කළ හෝ දැනට සේවය කරන යම්කිසි සභාපතිවරයකුගේ, උප සභාපතිවරයකුගේ, මන්ත්‍රීවරයකුගේ හෝ සභාවේ සේවකයකුගේ මෘත ශරීරයක් ආදහනය කිරීම සඳහා ගාස්තු අය නොකෙරේ.

(ඊ) මෘත ශරීරය ආදහනය කිරීම සඳහා ආදහනාගාරයට භාර දීමෙන් පසුව ආදහනය කරන අතරතුරේ දී හෝ ආදහනය කිරීමට පෙරාතුව හෝ ආදහනාගාර යන්ත්‍රසූත්‍රවල කාර්මික දෝෂයක් හෝ විදුලිය ඇණහිටීමක් හෝ මෘත දේහය ආදහනය කිරීමට නොහැකි වුවහොත් එම මෘත දේහය භූමදනය කිරීමට තීරණය කිරීමේ බලය සභාපතිවරයා සතු ය.

4. 2 වැනි වගන්තියේ දැක්වෙන අවසර පත්‍රයක් ලබා ගැනීම අපේක්ෂා කරන (මෙහි මින්මතු "ඉල්ලුම්කරු" යනුවෙන් හඳුන්වනු ලබන) යම් තැනැත්තෙකු, මෙහි පහත දැක්වෙන ලේඛන සමග මෙහි දෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරගත් ඉල්ලුම්පත්‍රයක් සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය :-

(අ) මියගිය තැනැත්තා සහ ඉල්ලුම්කරු අතර සම්බන්ධතාව තහවුරු කිරීමට අදාළ කරගත හැකිවනු පිණිස -

(i) ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත, හෝ
(ii) මියගිය අයගේ ජාතික හැඳුනුම්පත, හෝ
(iii) ඉල්ලුම්කරුගේ විවාහ සහතිකය, හෝ
(iv) මියගිය තැනැත්තා පදිංචි වී සිටි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ සහතිකය ;

(ආ) මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් උප්පැන්න හෝ මරණ ලියාපදිංචි කිරීමේ පනතේ නියමයන් අනුව හදිසි මරණ පරීක්ෂකවරුන් හා උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර්වරුන් විසින් සහතික කොට පහත සඳහන් ආකෘතින්වලින් ඉදිරිපත් කරනු ලබන මරණ සඳහා පමණක් ආදහනාගාරය වෙන්කර ගත හැක.

(i) B18 - මරණ පරීක්ෂක තැනගේ සහතිකය (39(1), 41 (1) 'උ' වගන්තිය)
(ii) B16 - මරණ දන්වීම් සහතිකය (41 (1) 'අ' වගන්තිය)
(iii) B20 - මරණ ලියාපදිංචි සහතිකය (42 (1) 'ආ' වගන්තිය)
(iv) B22 - මළ, උප්පැන්න සහතිකය (43 (1) 'ඉ' වගන්තිය)

5. මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ඉල්ලා ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත්‍රයක් මත අවසර පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කරන ලද්දේ නම්, එවැනි අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව පස්වැනි උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ලේඛනයක ලේඛනගත කිරීම සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය. මේ ලේඛනය අයදුම්පත් භාරගන්නා මාවනැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ පවත්වා ගත යුතු ය.

6. ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයකට අනුව යම් මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා භාර ගැනීමට තීරණය කරන ලද්දේ නම්, පළමුවැනි උපලේඛනය අනුව පනවන ලද නියමිත ගාස්තුව අයකර ගැනීමෙන් පසුව, සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඒ සඳහා හතරවැනි උපලේඛනය පරිදි වන අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. එකී අවසර පත්‍රයට අනුව ආදාහනය කිරීමට නියමිත මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත ගෙනැවිත් භාරදිය යුතු දිනය හා වේලාව එකී අවසර පත්‍රයෙහි පැහැදිලිව සටහන් කර තිබිය යුතු ය.

7. කිසියම් හේතුවක් මත ආදාහනය කිරීම සඳහා මෘත ශරීරයක් භාරනොගන්නේ නම්, සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඊට හේතුවූ කරුණු ද සමග ඒ බව වහාම ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

8. ආදාහනාගාරයේ ආදාහනය කිරීම සඳහා මෘත ශරීරය භාර ගැනීම සතියේ සෑම දිනකම පෙරවරු 6.00 සිට පස්වරු 7.00 දක්වා කාලය තුළ කළ යුතු ය.

9. නිකුත් කළ අවසර පත්‍රයේ නිරූපිත වේලාවන්ට හෝ ඊට පෙර මෘත දේහය ආදාහනාගාර භාරකරුට භාරදිය යුතු ය. එකී වේලාවට මෘත දේහය භාර දීමට ප්‍රමාදවීම හේතුවෙන් ඉල්ලුම්කරුට හෝ මියගිය තැනැත්තාගේ අයිතිවාසිකම් ඇති වෙනත් යම් තැනැත්තකුට සිදුවන යම් අපහසුතාවයක් හෝ අලාභයක් සම්බන්ධයෙන් මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වගකීමට යටත් නොවිය යුතු ය.

10. ආදහනාගාරයේ ආදාහනය කරන ලද එක් එක් මෘත දේහය සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ හයවැනි උපලේඛනයට සාරානුකූලව විස්තර ඇතුලත් කරන ලද ලේඛනයක් ආදාහනාගාර සහායක විසින් පවත්වාගෙන යා යුතු ය.

11. (අ) සෑම මෘත දේහයක්ම ආදාහනය කර පැය හැත්තෑ දෙකක් ගතවීමට මත්තෙන් ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතවරයෙකු විසින් එකී මෘත දේහයේ භෂ්මාවශේෂ භාරගත යුතු ය.

(ආ) මෘත දේහය ආදහනය කිරීම සඳහා ආදහනාගාරය වෙන්කර ගන්නා අවස්ථාවේ මෘත දේහය ආදහනය කිරීමෙන් පසු අලු තැන්පත් කර තැබීම සඳහා මරණකරුගේ නම සහ ලිපිනය සඳහන් භාජනයක් (තදින් මූඩිය වැසිය හැකි, මියගිය අයගේ ළඟම ඥාතීන් විසින් ආදාහනාගාර භාරකරු වෙත ලබාදිය යුතු ය.

(ඇ) ආදහනාගාරයෙන් ඉවත්කරනු ලබන අළු මියගිය අයගේ ළඟම ඥාතීන්ට හැර වෙනත් පුද්ගලයින්ට භාර දීමක් නොකළ යුතු ය.

(ඈ) එසේ වුවද ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත සභාපතිවරයාගේ බලයලත් නිලධාරියා විසින් එකී භෂ්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගන්නා කාල සීමාව දීර්ඝ කිරීම කරනු ලැබිය හැකි ය.

(ඉ) (ආ) ඡේදය යටතේ භෂ්මාවශේෂ ආදාහනාගාර භාරකරුගේ භාරයේ තබා ගැනීමට දීර්ඝ කරන කාලය, ආදාහනය සිදු කළ දින සිට සති දෙකකට නොවැඩි විය යුතු ය.

(ඊ) එසේ භෂ්මාවශේෂ ඉවත් කර ගැනීමට ඉඩදෙන ලද කාලය අවසන් වීමෙන් පසුව ද ඉවත් කර නොගත් භෂ්මාවශේෂ බැහැර කිරීමට මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ආදාහනාගාර භාරකරුට බලය තිබිය යුතු ය.

(උ) කිසියම් ඉල්ලුම්කරුවකු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් භාර නොගත් භෂ්මාවශේෂ, ආදාහනාගාර පරිශ්‍රයේ හෝ යම් සුසාන භූමියක වළ දැමීමට කටයුතු සැලැස්වීම මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය.

(ඌ) ආදහනාගාරයෙන් ඉවත් කරනු ලබන අළු II (ආ) වැනි වගන්තියේ සඳහන් විධි විධානයන් අනුව භාර දී ඇති භාජනයකට දමා ප්‍රවේශම් සහිතව තත්කාර්යය සඳහා වෙන්කොට ඇති කොටසෙහි හෝ කුටියෙහි ආදහනාගාරයෙහි භාරකරු විසින් තැන්පත් කර තැබිය යුතු ය.

12. (අ) කිසියම් ආදහනාගාරයක, ආදාහන කුටීරයට මෘත දේහය ඇතුල් කර එහි ආරක්ෂිත දොර වසා දැමීමෙන් පසුව කුටීරය ආවරණය කළ කොටසට ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයින් හැර වෙනත් යම් තැනැත්තකු ඇතුලත්වීම නොකළ යුතු ය.

(ආ) සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ හෝ ආදාහනාගාර භාරකරුගේ අවසරය නොමැතිව යම් තැනැත්තෙකුට ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල්වීම නොකළ යුතු ය.

(ඇ) (ආ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද -

(i) මෘත දේහයක් ආදාහනය කිරීමට යම් තැනැත්තකු අවසර පත්‍රයක් ලබා ඇත්තේ නම්, මෘත දේහය ආදාහනය සඳහා භාරදීමට ඔහු හෝ ඔහුගේ බලයලත් තැනැත්තකු සමග එකී අවස්ථාවට සහභාගීවන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් ; සහ

(ii) ආදාහනය කරන ලද යම් මෘත දේහයක භෂ්මාවශේෂ භාර ගැනීමට නියමිත දින හෝ එදිනට පෙර, අවසර පත්‍රය ලබා ඇති තැනැත්තා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා සමග පැමිණෙන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තියක්, ආදහනාගාර පරිශ්‍රයට ඇතුල්වීම අවසරය ලැබී ඇති තැනැත්තන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(ඈ) මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන යම් ගැටළුවක දී සභාපතිවරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් කරනු ලැබුවහොත් හා ඒ සඳහා නිසි බලය ලැබී ඇති අධිකරණයකින් වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය. තව ද, නොකඩවා එකී වරද කරනු ලබන සෑම අවස්ථාවක් සඳහාම දිනකට රුපියල් 250කට නොවැඩි දඩයකට ද එම තැනැත්තා යටත් වන්නේ ය.

13. යම් ආදාහනාගාර පරිශ්‍රයක් තුළ -

(අ) සාමය කඩවන ආකාරයෙන් හැසිරීම,
(ආ) ආදාහනාගාර පරිශ්‍රය තුළ ඇති මාවනැල්ල ප්‍රාදේශීය සභාවට අයත් දේපළවලට අලාභහානියක් කිරීම හෝ එසේ කිරීමට තැත්කිරීම,
(ඇ) ආදාහනාගාර භාරකරුගේ හෝ ඔහුගේ යම් සහායකයකුගේ රාජකාරියට බාධා කිරීම,
(ඈ) ආදාහානාගාර පරිශ්‍රය තුළ කිසියම් සැරසිල්ලක් කිරීම හෝ දැන්වීම් ඇලවීම නොකළ යුතු ය,
(ඉ) ආදහනාගාරය වෙන් කරනු ලබන අයෙකුගෙන් යම් දේපලකට හෝ ගොඩනැගිල්ලකට හෝ උපකරණයකට අලාභයක් වුවහොත් සභාපතිවරයා නියම කරනු ලබන තක්සේරු වටිනාකම ගෙවීමට ආදහනාගාරය වෙන්කරනු ලබන අය එකඟ විය යුතු ය.

14. (අ) මෘත ශරීර ආදාහනය කිරීමට සුදුසු තත්ත්වයකින් ආදාහනාගාර නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(ආ) යම් ආදාහනාගාරයක් ප්‍රතිසංස්කරණය කිරීමේ හෝ නඩත්තු කිරීමේ කාර්යය සඳහා එකී ආදාහනාගාරය වසා තබන්නේ නම්, ඒ පිළිබඳ නිවේදනයක් භාෂාත්‍රයෙන්ම මෘත දේහ ආදාහනය සඳහා අවසරපත් නිකුත් කරන කාර්යාලයේ සහ ආදාහනාගාර පරිශ්‍රයට ඇතුල්වන ස්ථානයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

"ආදාහන කුටීරය" යන්නෙන්, ආදාහනය කිරීම සඳහා මෘත දේහය තැන්පත් කරන කුටීරය සහ එකී කුටීරයට පිටතින් සාදන ලද බාහිර කුටීරය ද,
"ආදාහනාගාර පරිශ්‍රය" යන්නෙන්, සම්පූර්ණ ආදාහනාගාරය සහ ඊට අයත් භූමිය ද,
"ආදාහනාගාර භාරකරු" යන්නෙන්, තත් කාලයේ දී මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය සහ එහි කටයුතු භාරව සිටීමට පත්කරනු ලැබ ඇති යම් සේවකයකු ද,
"භෂ්මාවශේෂ" යන්නෙන්, යම් මෘත දේහයක් ආදාහනය කිරීමෙන් අනතුරුව, මෘත දේහයේ සහ එය තැන්පත් කර තිබූ යම් පෙට්ටියක නොදැවී ශේෂ වන යම් ද්‍රව්‍යයන්ද,
"මෘත ශරීරය" යන්නෙන්, මියගිය කිසියම් තැනැත්තකුගේ සම්පූර්ණ මෘත දේහය හෝ අජීවී දරු උපතක මෘත දේහය හෝ යම් මෘත දේහය හෝ මෘත දේහයකින් කිසියම් කොටසක් ද,
"සභාපති" යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,
"බලයලත්" නිලධාරියා යන්නෙන් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ එම සභාවේ යම් නිළධාරියෙකු හෝ සේවකයෙකු ද,
අදහස් විය යුතු ය.

16. මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙමළ හා ඉංග්‍රීසි පිටපත්වල නොගැලපෙන යම් අවස්ථාවක දී සිංහල පිටපත බලපැවැත් වේ.

*පළමුවැනි උපලේඛනය*

ආදාහනාගාරය පාවිච්චි කිරීමේ දී අයකරන ගාස්තු

| | | රු. ශ. |
|---|---|---|
| 01. | බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | 6,000 00 |
| 02. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | 7,000 00 |

*දෙවැනි උපලේඛනය*

(පිටපත් දෙකකින් ඉදිරිපත්කළ යුතු ය.)

**මාවනැල්ල ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ලබාගැනීමට ඉල්ලුම් කිරීම**

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :..................................................
ලිපිනය :..................................................
දුරකථන අංකය :..................................................
ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය හා නම :..................................................
ජාතික හැඳුනුම්පත් අංකය :..................................................

02. මියගිය අයගේ සම්පූර්ණ නම :..................................................
ස්ත්‍රී/පුරුෂ භාවය :..................................................
පදිංචිව සිටි ලිපිනය :..................................................
ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය හා නම :..................................................
ජාතික හැඳුනුම්පත් අංකය :..................................................

03. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධය :..................................................
(තහවුරු කිරීමට 4 වන අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සඳහන් සහතිකයක් අමුණන්න. ඒවා නම් ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් හෝ මියගිය අයගේ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් හෝ මියගිය අය පදිංචි වී සිටි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත්කළ සහතිකයේ පිටපතක්.)

04. මරණයට හේතුව :..................................................
(තහවුරු කිරීමට 4 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ සඳහන් සහතිකයක් අමුණන්න. B18 - මරණ පරීක්ෂක තැනගේ සහතිකය හෝ B16 - මරණ දන්වීම් සහතිකය හෝ B20 - මරණ ලියාපදිංචි සහතිකය හෝ B22 - මළ උප්පැන්න සහතිකය)

05. ආදාහනය කිරීමට ඉල්ලා සිටින දිනය හා වේලාව (කැමැත්තේ අනුපිළිවෙල අනුව) :

| | දිනය | වේලාව | | දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| (i) | 20 ........................ | පැය :............................ | (ii) | 20........................ | පැය :............................ |
| (iii) | 20........................ | පැය : ............................ | (iv) | 20 ........................ | පැය :............................ |

ඉහත සඳහන්කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරුවල සම්පූර්ණ වගකීම මා විසින් භාර ගනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි. අදාළ සහතික අමුණා ඇත.

..........................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : 20.................................................

*තෙවැනි උපලේඛනය*

.................................................................. මහත්මයා/මහත්මිය/මෙනෙවිය.

**මෘත දේහයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත්කිරීම ප්‍රතික්ෂේප කිරීම.**

ඔබ විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති පසු පිටේ දැක්වෙන අයදුම් පත්‍රයට අනුව, අවසර පත්‍රයක් නිකුත්කිරීම පහත දැක්වෙන හේතුමත ප්‍රතික්ෂේප කරන බව කණගාටුවෙන් දන්වනු කැමැත්තෙමි.

1. ..................................................................................
2. ..................................................................................
3. ..................................................................................
4. ..................................................................................

..........................................................................................
සභාපති/බලයලත් නිලධාරියාගේ අත්සන,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

දිනය : 20.................................

*හතරවැනි උපලේඛනය*

ආදාහනාගාර භාරකරු,
මාවනැල්ල ප්‍රාදේශීය සභා ආදාහනාගාරය.

*මෘත දේහයක් ආදාහනය කිරීමට නිකුත්කරන අවසර පත්‍රය*

*(අ)* .................................................................... යන අයගේ මෘත දේහය 20.................. මස ......................... දින පෙරවරු/පස්වරු....................... ට මාවනැල්ල ආදාහනාගාරයේ දී ආදාහනය කිරීමට මෙයින් අවසර දෙමි.

*(ආ)* 20......................................... දින, අංක ..................................................... දරන ලදුපත මගින් රු......................... ක් අයකර ගෙන ඇත.

*(ඇ)* මේ අවසර පත්‍රයේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් 10 වැනි අතුරු ව්‍යවස්ථාවේ පරිදි අදාළ ලේඛනයේ සටහන් තැබීමෙන් අනතුරුව මෘත දේහය ආදාහනය කිරීමට ක්‍රියා කරන්න.

*(ඈ)* අවසරපත් ලේඛනයේ අනුක්‍රමික අංකය........................................................... වේ.

..........................................................................................
සභාපති/බලයලත් නිලධාරියාගේ අත්සන,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

දිනය :.............................

*පස්වැනි උපලේඛනය*

*මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීමට නිකුත් කරන ලද අවසරපත්‍ර ලේඛනය*
*(කාර්යාලයේ පවත්වාගෙන යා යුතු ය.)*

| අනු. අංකය | දිනය | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ඉල්ලුම්කරුගේ දුරකථන අංකය | අයදුම්පත් අංකය | ලදුපත් අංකය | මුදල | මුදල් ගෙවූ දිනය | මියගිය අයගේ නම හා ලිපිනය | ආදාහනය කරන දිනය | වේලාව | අනුමැතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | | | | | | | | | | | |
| 02 | | | | | | | | | | | |
| 03 | | | | | | | | | | | |
| 04 | | | | | | | | | | | |
| 05 | | | | | | | | | | | |

*හයවැනි උපලේඛනය*

*මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ ආදහනය කරන මෘත දේහ පිළිබඳ ලේඛනය*
*(ආදහනාගාර භාරකරු යටතේ පවත්වාගෙන යා යුතු ය.)*

| අනු. අංකය | මියගිය අයගේ නම හා ලිපිනය | ස්ත්‍රී/පුරුෂ භාවය | අවසරපත් ලේඛනයේ අනු. අංකය | ආදහනය කළ | | භස්මාවශේෂ ගෙන ගිය දිනය |
|---|---|---|---|---|---|---|
| | | | | දිනය | වේලාව | |
| 01 | | | | | | |
| 02 | | | | | | |
| 03 | | | | | | |
| 04 | | | | | | |
| 05 | | | | | | |

02-300

---

**දූරණියගල ප්‍රාදේශීය සභාව**

**අතුරු ව්‍යවස්ථා**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් ලැබී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, ප්‍රාදේශීය සභා පනතේ 123 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහීපාල හේරත්,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
සබරගමුව පළාත.

2015 නොවැම්බර් මස 26 වැනි දින.

**සති පොළ පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව දූරණියගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සතිපොළ විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය සඳහා වන අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. සභාව විසින් ඉදිකර පවත්වාගෙන යනු ලබන කිසියම් සති පොළක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් නියමයන් පිළිපැදීම දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් කළ යුතු ය :-

   (i) සතිපොලේ සියළුම ගොඩනැගිලි සියල්ල ම ගඩොලින් හෝ බ්ලොක් ගල් වැනි ස්ථිර ඉදිකිරීම් ද්‍රව්‍යයකින් හෝ ස්ථිරව ඉදිකර තිබිය යුතු අතර සෑම සති පොළ ගොඩනැගිල්ලකම බිමට කොන්ක්‍රීට් යොදා පොළව මට්ටමේ සිට අවමය අඩි එකක පමණ උසින් සිටින සේ ගෙබිම ඉදිකර තිබිය යුතු ය. ;

   (ii) වහළය කිසියම් ස්ථිර සෙවිලි ද්‍රව්‍යයකින් තනා නිමකර තිබිය යුතු ය. ;

   (iii) පොළ ඇතුළත වෙළෙඳ කඩ කාමර පේළි දෙකක් අතර අවම පරතරය මීටර් 2ක් පළලින් සමන්විත විය යුතු අතර, පේළි දෙක අතර වේදිකාව පරිහරණය කරන්නන්ගේ ගමනාගමනයට උචිත පරිදි ස්ථිර ඉදිකිරීම් ද්‍රව්‍යයකින් ඉදිකර තිබිය යුතු අතර වැසි ජලය මඟී ගමනාගමනයට බාධා නොවන ආකාරයට බැස යාමට සලස්වා තිබිය යුතු ය. ;

(iv) සති පොළ ඇතුළත ඉදිකරනු ලබන සෑම වෙළෙඳ මැස්සක් ම ගඩොලෙන් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් ඉදිකළ බැම්මක් මත කොන්ක්‍රීට් තහඩුවකින් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් නිමකළ තට්ටුවකින් යුක්ත විය යුතු ය. කෙසේ වුව ද කොන්ක්‍රීට් තහඩුවකින් තට්ටුව නිමකර ඇති විට එකී තට්ටුව කපරාරු කර සිමෙන්තියෙන් ඔපදමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. ඒ ආකාරයෙන් වෙළෙඳ මැහි තැනීමට නොහැකිවන යම් අවස්ථාවක, පොළොව මත සමතලා ආකාරයෙන් වූ ඉඩ කොටස් තනා තිබිය යුතු අතර එකී කොටස් ගඩොලින්, සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් නිමකර සිමෙන්තියෙන් කපරාරු කර තිබිය යුතු අතර, එක් එක් කොටස වෙන් කෙරෙන ඉරි සලකුණු කහ පාටින් ලකුණු කර තිබිය යුතු ය. ;

(v) සෑම වහලයකම වැහි පීලි යොදා තිබිය යුතු අතර වැහි පීලිවල රැස්වෙන ජලය පහළට බැස යාමට ප්‍රමාණවත් බට සවිකර තිබිය යුතු ය. ;

(vi) ස්ථානයේ කාර්යයන්ට යොදා ගන්නා ජලය ගබඩාකර තබන්නේ නම් එසේ ගබඩාකර තබන ජලය අපවිත්‍ර වීමෙන් වළක්වා ගැනීමට ප්‍රමාණවත් ආරක්‍ෂක විධිවිධාන සලස්වා තිබිය යුතු ය. ;

(vii) ස්ත්‍රී පුරුෂ දෙපක්‍ෂයටම හා ආබාධිත පුරවැසියන් සඳහා විශේෂ පහසුකම් සහිත වෙන වෙනම සැකසූ වැසිකිළි හා කැසිකිළි ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර, එකී සෑම වැසිකිළියකම බිම ද අවම වශයෙන් පොළොව මට්ටමේ සිට මීටර් 01ක් උසට බිත්ති පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. ;

(viii) සතිපොළ ගොඩනැගිලි දෙකක් අතර පාරිභෝගිකයන් ගමන් කරන පදික කොටස් අව්වෙන් වැස්සෙන් ආවරණය වන පරිදි සකසා තිබිය යුතු අතර, වහලෙන් වැස්සෙන ජලය විධිමත්ව සකස් කළ කාණු පද්ධතියකට ගලා යෑමට සකස් කර තිබිය යුතු ය. ;

(ix) සතිපොළ පරිශ්‍රය තුළ සභාව විසින් අනුමත කළ සැලැස්මකට අනුව ආපනශාලාවක් හෝ තේ, කෝපි කඩයක් ඉදිකර පවත්වාගෙන යාම නීත්‍යානුකූල වන්නේ ය. ;

(x) සතිපොළ සෑම වෙළෙඳ ස්ථානයකටම අවශ්‍යතාවය අනුව භාවිතා කිරීම සඳහා විදුලි සැපයුමක් ලබා දීම සභාවේ කාර්යය වන්නේ ය. ;

(xi) සති පොළ පරිශ්‍රය තුළ ආගමික කාර්යයන් ඉටු කිරීම සඳහා පහසුකම් සලසා දීම දැරණියගල ප්‍රාදේශීය සභාවේ කාර්යය වන්නේ ය. ;

(xii) පරිශ්‍රය ඇතුළත පොදු ජල කරාම සවි කර තිබිය යුතු ය. ;

(xiii) එළවළු හෝ පළතුරු සේදීම සඳහා වෙන වෙනම ස්ථානයක් වෙන්කර තිබිය යුතු අතර, පොදු වැසිකිළිවල ඇති ජල කරාම හා පානීය ජලය සඳහා සවිකර ඇති ජල කරාම ඉහත සඳහන් කළ කාර්යයන් සඳහා භාවිතා නොකළ යුතු ය. ;

(xiv) සතිපොළ පරිශ්‍රය ඇතුළට එක එල්ලේ හා වහලය මතට පතිත වන වර්ෂා ජලය හා එළවළු හා පළතුරු සේදීම සඳහා වෙන්කළ ස්ථානයෙන් බැහැර කෙරෙන ජලය නිසි ආකාරයෙන් ගලා යාමට ප්‍රමාණවත් කාණු පද්ධතියක් තනා තිබිය යුතු අතර එකී අප ජලය බාධාවකින් තොරව ගලා යාමට සලස්වා තිබිය යුතු ය. ;

(xv) සතිපොළෙහි වෙළෙඳ ස්ථානවල පිහිටීම සැලකිල්ලට ගනිමින් දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් මස්, මාළු, කරවල, එළවළු, පළතුරු සිල්ලර බඩු හා වෙනත් වෙළෙඳ ද්‍රව්‍ය විකිණීම සඳහා සති පොළ කොටස්වලට බෙදා වෙන් කිරීම ද, නාමිකව ප්‍රදර්ශනය කිරීම ද, දැරණියගල ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතු ය. ;

(xvi) පරිශ්‍රය තුළ ජනනය වන අපද්‍රව්‍ය -

*(අ)* ජෛවහායන අපද්‍රව්‍ය,
*(ආ)* වීදුරු,
*(ඇ)* කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
*(ඈ)* පොලිතීන් හෝ ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය සහ රිජිෆෝම්,
*(ඉ)* යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ සම්මිශ්‍රණ කොටස්,
*(ඊ)* අන්තරායකර අපද්‍රව්‍ය,

වෙන වෙනම රැස්කළ හැකි බක්කි හෝ භාජන හෝ ටැංකි හෝ එකී සති පොළෙහි වෙනම ස්ථානයක තබා තිබිය යුතු අතර ජෛවහායන අපද්‍රව්‍ය බහාලීම සඳහා තනනු ලැබූ බක්කිය හෝ භාජනය හෝ ටැංකිය මීයන්ට, මැස්සන්ට, වෙනත් කෘමීන්ට හෝ කවර හෝ පක්ෂියෙකුට ඇතුල්වීමට නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබීම හෝ පරිශ්‍රයේ ජනනය වන කසල බැහැර කිරීමේ විධිමත් ක්‍රමයක් සකසා තිබිය යුතු යි. ;

3. (1) සති පොළෙහි ඇති කිසියම් වෙළෙඳ ස්ථානයක භාණ්ඩ විකුණනු ලබන තැනැත්තන් හෝ සතිපොළ පරිශ්‍රය තුළ ජංගම වෙළෙඳාම සඳහා ටිකට් පතක් ලබාගෙන ඇති කිසියම් තැනැත්තෙකු විසින් වෙළෙඳ පරිශ්‍රය හෝ ඒ අසල හෝ වෙළෙඳ මැස්ස මත හෝ ඒ අසළ ජනනය වන සියලුම අපද්‍රව්‍ය -

*(අ)* ජෛවහායන අපද්‍රව්‍ය,
*(ආ)* වීදුරු,
*(ඇ)* කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
*(ඈ)* පොලිතීන් හෝ ප්ලාස්ටික් හෝ පොලිතීන් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය සහ රිජිෆෝම්,

(ඉ) යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ සම්මිශ්‍රණ කොටස්,
(ඊ) අන්තරායකර අපද්‍රව්‍ය,

යන වර්ග යටතේ වර්ග කර ඒ එක් එක් වර්ගයේ අපද්‍රව්‍ය බහාලීමට දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් තනා ඇති වෙන් වෙන් වූ බක්කිවලට හෝ භාජනවලට හෝ ටැංකිවලට දැමීම හෝ සභාව විසින් අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා හඳුන්වා දී ඇති ක්‍රමවේදයට අනුව අපද්‍රව්‍ය බැහැර කිරීම, එකී තැනැත්තන්ගේ කාර්යය විය යුතු ය.

(ii) සති පොළෙහි තබා ඇති අපද්‍රව්‍ය රැස්කරන කවර හෝ භාජනයක, බක්කියක හෝ ටැංකියක බහාලීමට වෙන්කළ වර්ගයේ අපද්‍රව්‍ය හැර වෙනත් වර්ගයක අපද්‍රව්‍ය එකී භාජනයට, බක්කියට හෝ ටැංකියට දැමීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

(iii) 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ (xxi) වැනි ඡේදයේ නියමයන් යටතේ ජෛවභායන අපද්‍රව්‍ය බහාලීම සඳහා තනා ඇති බක්කියට හෝ භාජනයට හෝ ටැංකියට අපද්‍රව්‍ය බහාලන අවස්ථාවේ හෝ අපද්‍රව්‍ය ඉන් පිටතට ගන්න අවස්ථාවේ දී හැර වෙනත් සෑම අවස්ථාවකදී ම එකී බක්කියේ හෝ භාජනයේ හෝ ටැංකියේ පියන හොඳින් වසා තැබීම කළ යුතු ය.

4. (i) කවර හෝ සති පොළක වෙළෙඳාම සඳහා වෙන්කළ ඉඩ ප්‍රමාණය යන්නෙන් සභාව විසින් නිශ්චිතව සලකුණු කරන ලද සීමාවන් අදහස් වේ.

(ii) විකිණීම සඳහා සතිපොළ වෙත රැගෙන එනු ලබන කවර හෝ ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් හෝ වෙළඳාම සඳහා යොදාගන්නා කිසියම් උපකරණයක් හෝ වෙනත් යම් කවර හෝ දෙයක් එකී ද්‍රව්‍ය හෝ භාණ්ඩ සති පොළ තුළට රැගෙන එනු ලබන අවස්ථාවක දී හෝ ඉන් බැහැරට ගෙනයනු ලබන අවස්ථාවක දී හැර වෙනත් කවර හෝ අවස්ථාවක දී ඉහත 04.1 හි සඳහන් කරන ලද වෙළඳාම සඳහා වෙන් කර ඇති සීමාවෙන් පිටත තැබීම හෝ එසේ කිරීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(iii) සතිපොළ ඇතුළත සීමා සලකුණු කර වෙළඳ කටයුතු සඳහා අවසර දී ඇති පරිශ්‍රය තුළ හා ජංගම වෙළඳාමේ නිරත වීම සඳහා අවසර ලබා දී ඇති ස්ථාන වල හැර වෙනත් කවර ස්ථානයක හෝ වෙළඳාම නොකළ යුතු අතර පදික කොටස්වල ගමන් කරනු ලබන තැනැත්තන්ට බාධාවන ආකාරයේ කිසිදු ක්‍රියාවක් නොකළ යුතු ය.

5. 2 ix වගන්තියේ සඳහන් ස්ථානයක හැර සතිපොළ පරිශ්‍රය තුළ වෙනත් කවර හෝ ස්ථානයක ඉවුම් පිහුම් කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

6. දූරණියගල ප්‍රාදේශීය සභාව සතු කිසියම් සතිපොළක -

(i) ඇතුළත අසංවරව හැසිරීම හෝ කළ කෝලාහල කිරීම හෝ මත්ද්‍රව්‍ය, මත්පැන් පානය කර හැසිරීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ හිඟමන් ඉල්ලීම,

(ii) දෛනික කටයුතු අවසානයේ සතිපොළ වසා දැමීමෙන් අනතුරුව එහි පරිශ්‍රය ඇතුළත රැඳී සිටීම,

(iii) කිසියම් ගොඩනැගිල්ලකට, ඉදිකිරීමකට හෝ සවිකිරීමකට හෝ අලංකරණය පිණිස වවා ඇති හෝ තබා ඇති කිසියම් මල් පඳුරකට හෝ නාම පුවරුවකට හෝ වෙනත් ද්‍රව්‍යයකට හෝ හානි කිරීම හෝ අලාභ කිරීම හෝ විකෘති කිරීම හෝ විරූපි කිරීම,

(iv) පාවිච්චිය සඳහා සපයා ඇති ජලය අපිරිසිදු කිරීම හෝ අපතේ යැවීම හෝ අපතේ යාමට ඉඩ හැරීම හෝ වෙනත් කිසියම් ආකාරයකින් නාස්ති කිරීම හෝ එකී ජලයෙන් ස්නානය කිරීම හෝ රෙදි හෝ සතුන් සේදීම සහ එළවළු සහ පළතුරු සේදීමට වෙන්කළ ස්ථානයේ හැර වෙනත් යම් ස්ථානයක එළවළු හෝ පළතුරු සේදීම,

(v) විදුලිය සම්බන්ධතාව ලබාදී ඇති ප්‍රධාන යතුරු පුවරුව අසළට ළඟා වීමට බාධා කරන ආකාරයෙන් බඩු භාණ්ඩ තැබීම හෝ ප්‍රධාන යතුරු පුවරුවට හානි කිරීම,

(vi) ජල සම්බන්ධතාව ලබාදීම සඳහා ගොඩනැගිල්ල තුළ එලා ඇති ප්‍රධාන ජලනළයෙන් හෝ වෙනත් කිසියම් ජලනළයකින් වංචනිකව ජල සම්බන්ධතාවක් ලබා ගැනීම,

(vii) තත් කාර්යය සඳහා වෙන්කළ ස්ථානයක හැර කවර හෝ වර්ගයක එළවළු, මස් හෝ මාළු විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම,

(viii) සති පොළ පරිශ්‍රය තුළ සකස්කර ඇති වාහන නැවතුම් ස්ථාන හැර වෙනත් ස්ථාන වලට පාපැදි හෝ යතුරු පැදි හෝ මෝටර් වාහන රැගෙන ඒම හෝ එසේ කිරීමට ඉඩදීම, කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

7. (i) කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතක දී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස පොදු වෙළඳ පොළෙහි කවර හෝ ආකාරයක වෙළෙඳාමෙහි හෝ එසේ වෙළඳාමේ නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකයෙකු වශයෙන් හෝ නියුක්තවීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

(ii) හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් පොදු වෙළඳ පොළෙහි කවර හෝ ආකාරයක වෙළඳාමක නියුක්තවීම හෝ නියුක්තවීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

8. සති පොළ පරිශ්‍රය සතිපොළ පැවැත්වෙන දිනට පෙර දින සම්පූර්ණයෙන්ම පිරිසිදු කිරීමත්, සති පොළ පැවැත්වෙන දිනය අවසානයේ දී නැවත වතාවක් සම්පූර්ණයෙන්ම පිරිසිදු කිරීමත්, දූරණියගල ප්‍රාදේශීය සභාවේ කාර්යය වන්නේ ය.

9. සති පොළෙහි එළවළු, පළතුරු, මස්, මාළු, කරවල හෝ වෙනත් ආහාර හෝ පාන වර්ග විකිණීම කරනු ලබන තැනැත්තන් විසින් අදාල සතිපොළ පැවැත්වෙන දිනය අවසානයේ දී තමන් වෙළඳාමේ නියුක්ත වෙළඳ පරිශ්‍රය හෝ මැස්ස අවස්ථාවෝචිත පරිදි සෝද හෝ සූරා පිරිසිදු කිරීම කළ යුතු ය.

10. දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් වෙළඳපොල පරිශ්‍රය වෙන්කර දී ඇත්තේ කිනම් වර්ගයක භාණ්ඩ හෝ ද්‍රව්‍ය වෙළෙඳාමක් සඳහා ද එසේ වෙන් කරන ලද වර්ගයේ භාණ්ඩ හෝ ද්‍රව්‍ය හැර වෙනත් කවර හෝ ආකාරයක භාණ්ඩ හෝ ද්‍රව්‍ය විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

11. ගෝ ඝාතක ආඥාපනතේ නියමයන් යටතේ විධිමත් බලපත්‍රයක් ලබා ඇති හෝ ඝාතකාගාරයකදී මරනු ලැබූ කිසියම් සතෙකුගේ මස් වන්නේ නම් මිස සති පොළෙහි මස් වෙළඳ ස්ථානයක අලෙවි කිරීම සඳහා හෝ අලෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

12. කවර හෝ සෝගාතකාගාරයක් තුළ කිසියම් දිනයක දී මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝඝාතක ආඥාපනතේ 17 වන වගන්තියේ බලතල ප්‍රකාර නිසි අධිකාරය විසින් නියමයක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක, සති පොළ ඇතුළත පවත්වාගෙන යනු ලබන කවර හෝ මස් කඩයක වෙළඳාම් කිරීම පිණිස මස් තබා ගැනීම හෝ වෙළඳාම පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතු ය.

13. කවර හෝ තැනැත්තෙකු විසින් සතිපොළ පරිශ්‍රය ඇතුළට සුනඛයෙකු හෝ බළලෙකු හෝ වෙනත් කවර හෝ සතෙකු හෝ පක්ෂියකු රැගෙන ඒම හෝ රැගෙන ඒමට ඉඩදීම හෝ නොකළ යුතු ය. මේ නියමය කිසියම් පරීක්ෂණ කාර්යයක් සඳහා යම් පොලිස් නිලධාරියෙකු විසින් පොලිස් නිල සුනඛයෙකු සතිපොළ ඇතුළට රැගෙන එනු ලැබීම වළක්වන නියමයක් ලෙස තේරුම් නොගත යුතු ය.

14. සති පොළෙහි වෙළඳාම් අවසන් කර සති වෙළඳ පොළ සම්පූර්ණයෙන් ම වසා තබන අවස්ථාවක සහ සති පොළෙහි කිසියම් වෙළඳ මැස්සක් වසා දමා බැහැරට යන සෑම අවස්ථාවකදීම එකී වෙළඳ පරිශ්‍රයේ සියළුම විදුලි පහන්, විදුලි පංකා සහ වෙනත් විදුලි උපකරණ අක්‍රියකර දැමීම කළ යුතු ය.

15. 2 (xi) වගන්තියෙන් පහසුකම් සලසා ඇති ස්ථානයේ හැර සතිපොල පරිශ්‍රය තුළ වෙනත් කුමන හෝ ස්ථානයක ආගමික කාර්යයන් උදෙසා පහන් ඉටිපන්දම් ආදිය දැල්වීම නොකළ යුතු ය.

16. සති පොළෙහි ඇති සෑම වැසිකිළියක් හා කැසිකිළියක් ම සති පොළ පැවැත්වෙන සෑම දිනයකම අවම වශයෙන් දිනකට තුන් වතාවක් බැගින් විෂබීජ නාශක යොදා සෝදා හැරීමෙන් පිරිසිදු කිරීමටත් ජලය ගලා යාමට ඉදිකර ඇති සෑම කාණුවක්ම සති පොළ පැවැත්වෙන දිනයේ දී දිනකට දෙවතාවක් බැගින් සෝදා පිරිසිදු කිරීමටත් සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය වන්නේ ය.

17. 2 වැනි අතුරු ව්‍යවස්ථාවේ (xvi) වැනි ඡේදයේ නියමකර ඇති ආකාරයෙන් තනා ඇති සෑම බක්කියක, භාජනයක හෝ ටැංකියකම රැස්කරනු ලබන අපද්‍රව්‍ය, සති පොළ පැවැත්වෙන දිනයේ දී අවම වශයෙන් දිනකට එක් වතාවක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වැඩි වාර ගණනකින් එකී ස්ථානයෙන් ඉවත් කිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

18. සති පොළෙහි කිසියම් වෙළඳ ස්ථානයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට 23 වන අතුරු ව්‍යවස්ථාව යටතේ අවසරපත් ලබා ගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් එකී අවසර පත්‍රය අන්සතු කිරීම හෝ එකී අවසර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ කිනම් වෙළඳ පරිශ්‍රයක්/වෙළඳ මැස්සක් සඳහා ද එකී වෙළඳ ස්ථානයක් නොවන වෙනත් කිසියම් ස්ථානයක වෙළඳාම් කිරීම හෝ නොකළ යුතු අතර, කවර හෝ තැනැත්තෙකු එසේ ක්‍රියාකර තිබෙන බවට සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා සෑහීමට පත්වී ඇති අවස්ථාවක ඔහු නියමිත ස්ථානයේ වෙළඳාම් සඳහා යොමු කිරීමට නැතහොත් එකී දිනයේ දී වෙළඳාම් කටයුතුවලින් වළක්වා සති පොළෙන් ඉවත් කිරීම හෝ ඔහු වෙත නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට බලය තිබිය යුතු ය.

19. කිසියම් සති පොළක වෙළඳ ස්ථානයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ලබාගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් ස්ථාන නිර්ණය කිරීම සම්බන්ධයෙන් සභාව සමග ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව තමාගේ වෙළඳ කාර්යය සඳහා වෙන්කර ගත් එකී වෙළෙඳ ස්ථානයේ ඉඩකඩ නැතහොත් ඉන් කිසියම් කොටසක් කවර හෝ භාණ්ඩ හෝ ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමට හෝ වෙළෙඳාම් කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීමට හෝ වෙනත් කවර හෝ කාර්යයකට වෙනත් යම් තැනැත්තෙකුට ඉඩදීම නොකළ යුතු ය.

20. දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් කලින් තීරණය කර, තත් කාර්යය සඳහා බලය දී ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් සති පොළෙහි කිසියම් වෙළඳ පරිශ්‍රයක නිර්මිත සැලැස්ම වෙනස් කරන හෝ එකී සැලැස්මට හානි කරන හෝ ආකාරයේ කිසිදු ඉදිකිරීමක් හෝ සවි කිරීමක් හෝ වෙනස් කිරීමක් හෝ කොටු කිරීමක් නොකළ යුතු ය.

21. දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් සති පොළක් විවෘතව තැබිය යුතු දිනයන් සහ වේලාවන් කලින් කල දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ය. දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් එසේ තීරණය කරනු ලැබූ ආකාරයට සති පොළ විවෘතව තබන දිනයන් සහ වේලාවන් කවරේද යන්න භාෂාත්‍රයෙන් ම දැන්වීමක් හෝ දැන්වීම් ප්‍රකටව පෙනෙන ආකාරයෙන් සති පොළට ඇතුල්වීමේ දොරටුව අසළ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

22. සතිපොළ වෙළෙඳ ස්ථානවල වෙළඳාමේ නිරත වන ඕනෑම තැනැත්තෙක් දූරණියගල, ප්‍රාදේශීය සභාව මගින් මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමු වන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ අවසර පත්‍රයක් ලබා ගෙන ඇත්තේ නම් මිස කිසිදු වෙළෙඳ කාර්යයක නිරත නොවිය යුතු ය. එකී ගාස්තු ප්‍රමාණයන් දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

23. දූරණියගල ප්‍රාදේශීය සභාව සතිපොළ වෙළඳ පරිශ්‍රයන් වෙන් කර දීම සඳහා අත්සන් කර ඇති ස්ථාන නිර්ණය කිරීම සඳහා වූ ගිවිසුම් පත්‍රයේ නියමයන්ට හා කොන්දේසි වලට අනුකූල වන්නේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් සතිපොළේ වෙළෙඳ පරිශ්‍රයන් පාවිච්චි කිරීම හෝ පරිහරණය නොකල යුතු ය.

24. සතිපොළෙහි වෙළඳ කාර්යයේ නිරත වන ඕනෑම තැනැත්තෙක් දූරණියගල ප්‍රාදේශීය සභාව සමග දෙවන උපලේඛනයේ ප්‍රකාර වාර්ෂිකව අත්සන් කරනු ලබන වෙළඳ පරිශ්‍ර සඳහා වූ ඉඩකඩ වෙන්කිරීමේ (ස්ථාන නිර්ණය කිරීමේ) ගිවිසුම් පත්‍රයකට අත්සන් තැබිය යුතු අතර ගිවිසුමේ සඳහන් කොන්දේසීන්ට හා නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතු ය.

25. 24 වැනි අතුරු ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණේ වුව ද මේ කොටසේ අතුරු ව්‍යවස්ථා බලාත්මක වන දිනය වන විට දූරණියගල ප්‍රාදේශීය සභාව සතුව තිබෙන කිසියම් සතිපොළක එක් එක් වෙළෙඳ පරිශ්‍ර සම්බන්ධයෙන් දූරණියගල ප්‍රාදේශීය සභාව සමග අවසන් වරට අත්සන් කරන ලද සතිපොළ ස්ථාන නිර්ණය කිරීමේ ගිවිසුමේ සඳහන් වෙළඳ කාර්යයේ නිරත වන පුද්ගලයෙකු එකී බලාත්මක දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි 23 වන අතුරු ව්‍යවස්ථාව යටතේ එකී වෙළඳ පරිශ්‍රය පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට තෝරා ගනු ලැබූ වෙළඳ කාර්යයේ නිරත වන්නෙකු වශයෙන් සැලකීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ තවදුරටත් මේ අතුරු ව්‍යවස්ථාව අදළ වන කවර හෝ වෙළෙඳ කාර්යයේ නිරත වන්නෙකු මේ කොටසේ අතුරු ව්‍යවස්ථා බලාත්මක වන දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත් 24 වන වගන්තියේ සඳහන් නියමයන්ට අනුව නව ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

26. (i) 24 වැනි සහ 25 වැනි අතුරු ව්‍යවස්ථාවල නියමයන් යටතේ දූරණියගල ප්‍රාදේශීය සභාව සමග අත්සන් කරනු ලැබූ යම් ගිවිසුමක් එක් වර්ෂයක කාලයක් සඳහා පමණක් වලංගු විය යුතු අතර, එකී වර්ෂයක කාලය අවසන් වීමට මාසයකට පෙර ඉදිරි වර්ෂය සඳහා දූරණියගල ප්‍රාදේශීය සභාව සමග අලුත් ගිවිසුමකට එළැඹීමෙන් පසුව තවත් එක් වර්ෂයක කාලයක් සඳහා එකී සතිපොළ වෙළඳ පරිශ්‍රයන් වෙන් කර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ ආකාරයෙන් ම යම් අනුගාමී වර්ෂයක් සඳහා එකී වෙළඳ පරිශ්‍රයේ ගිවිසුමක කාලය වාර්ෂිකව වලංගු කරවාගෙන එකී වෙළෙඳ ස්ථානය පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට එකී ගිවිසුම්කරුට හිමිකම තිබිය යුතු ය.

(ii) කෙසේ වුව ද 26 (i) ඡේදය යටතේ කිසියම් ගිවසුම්කරුවෙකු විසින් අනුගාමී වර්ෂය සඳහා ගිවිසුම්ගත කාලය වලංගු කරවාගෙන එකී වෙළෙඳ පරිශ්‍රය පාවිච්චි කරන හෝ පරිහරණය කිරීම සඳහා එකී අනුගාමී වර්ෂය තුළ ගෙවිය යුතු දෛනික අවසරපත්‍ර ගාස්තුව මෙම අතුරු ව්‍යවස්ථාවේ තුන්වන උපලේඛනය සාරානුකූල විය යුතු ය.

27. කිසියම් වෙළෙඳ පරිශ්‍රයක ගිවිසුම් කාලය අවසන් වන දින සිට එක් මාසයක කාලයක් ගත වීමට මත්තෙන් 30 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඉදිරි වර්ෂය සඳහා ගිවිසුම් කාලය වලංගු කරවාගෙන ඇත්තේ නම් මිස කවර හෝ ගිවිසුම්කරුවෙකුට, පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට දී ඇති එකී වෙළඳ පරිශ්‍රය එකී මාසය අවසන් වන දිනෙන් පසුව පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට හිමිකමක් නොතිබිය යුතුය.

28. සති පොළෙහි කිසියම් වෙළඳ පරිශ්‍ර වෙන්කර දීමේ ගිවිසුම් පත්‍රයට අනුව වෙළඳ පරිශ්‍රය වෙන්කර ගෙන ඇති ගිවිසුම්කරු හැර වෙනත් කිසිවෙකු වෙළඳාම් කටයුතුවල නිරත වීම නීත්‍යානුකූල නොවන අතර එම ස්ථානයේ වෙනත් අයෙකු වෙළඳාම් කටයුතුවල නිරත කිරීමක් සිදුකර ඇති බව අනාවරණය වීම මත ගිවිසුම අවලංගු කිරීම හේතුවෙන් හා එකී වෙළඳ පරිශ්‍රය ආපසු දූරණියගල ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම හේතුවෙන් එකී ගිවිසුම්කරුට සිදුවන කිසියම් අලාභයක් හෝ හානියක් හෝ පාඩුවක් එකී ගිවිසුම්කරු වෙතම පැවරෙන අතර දූරණියගල ප්‍රාදේශීය සභාව හෝ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ බලයලත් නිලධාරියා හෝ ඒ පිළිබඳව වගකීමට යටත් නොවනු ඇත.

29. සතිපොළ වෙළෙඳ පරිශ්‍රයන් වෙන් කිරීම සඳහා ගිවිසුම්ගත වීමේදී දූරණියගල ප්‍රාදේශීය සභාවේ මහ සභාව විසින් කලින් කල නියම කරනු ලබන ගිවිසුම්කරු විසින් එකවර ගෙවිය යුතු මුදලක් අයකර ගිවිසුම්ගතවීම නීත්‍යානුකූල වන්නේ ය.

30. (i) සති පොළෙහි කිසියම් වෙළෙඳ ස්ථානයක් සඳහා ගිවිසුම්කරු විසින් දූරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු එක් එක් දිනයේ උපලේඛන අංක 02 හි සඳහන් අවසර පත්‍ර ගාස්තුව ගෙවිය යුතු අතර එවැනි අවසර පත්‍ර ගාස්තුවක් ගෙවන ලෙස ආදයම් පරිපාලක හෝ සභාවේ සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් ඕනෑම නිලධාරියෙකු ඉල්ලා සිටින අවස්ථාවක දී ගෙවීමකින් තොරව වෙළඳ කාර්යයේ නිරත වන ඕනෑම පුද්ගලයෙක් අනවසරයෙන් වෙළෙඳ කටයුතුවල නිරත වන්නෙකු සේ සලකා වෙළඳ පරිශ්‍රයෙන් බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(ii) සතිපොළ පැවැත්වෙන යම් දිනයක දී ප්‍රථම වතාවට පැමිණෙන වෙළෙන්දෙකුට ගිවිසුම්ගත වීමකින් තොරව එදිනට පමණක් අවසරපත්‍රයක් ලබාගෙන වෙළෙඳ පරිශ්‍රයක් භාවිතා කිරීමට හැකිවන අතර පසුව එළඹෙන පළමු සතිපොළ දිනය වනවිට නීත්‍යානුකූල වෙළෙඳ පරිශ්‍රයක් වෙන්කර ගැනීමට කටයුතු කළ යුතු ය.

(iii) 30 (i) වගන්තියේ යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර දරන්නන් අතර හෝ එකී අවසර පත්‍ර දරන්නන්ගේ බලයලත් සේවකයින් අතර හෝ ඔවුන් මහජනයා අතර වෙළඳපොළ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ඇතිවන යම් ආරවුලක් සභාපති විසින් හෝ සභාපති විසින් බලය පවරනු ලැබූ පොළ භූමිය තුළ රාජකාරියෙහි යෙදී සිටින කිසියම් නිලධාරියෙකු විසින් නිරවුල් කළ හැකි ය.

(iv) සතිපොළ පිහිටි භූමිය තුළ සාමය පවත්වා ගැනීම සභාව විසින් පත්කරනු ලබන සහ පොළ පිහිටි භූමිය තුළ රාජකාරියේ යෙදී සිටින නිළධාරියෙකු විසින් කළ යුතු ය.

(v) බඩු මිලදී ගැනීම සඳහා හෝ විකිණීම සඳහා පොළට පැමිණෙන සෑම තැනැත්තෙකු විසින් ම සභාවේ නිළධාරියෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් කිසියම් ආරවුලක් නිරවුල් කිරීම සඳහා හෝ සාමය ආරක්ෂා කිරීම සඳහා දෙනු ලබන යම් නීත්‍යානුකූල නියෝගයක් පිළිපැදිය යුතු ය.

(vi) පොළ පිහිටි භූමිය ඇතුළත විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති යම් ආහාර ද්‍රව්‍යයක් ආහාර පිණිස යෝග්‍ය නොවන බව තමාට පෙනී ගියහොත් සභාපතිවරයා විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් හෝ සභාපතිවරයාගේ බලය යටතේ ක්‍රියාකරන යම් සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් ඒ ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කොට තහනමට ගැනීමට නීත්‍යානුකූල විය යුතු යි.

(vii) vi ඡේදය යටතේ තහනම් කරන ලද ද්‍රව්‍යයක් ආහාරයට නුසුදුසු බව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබුවහොත් ඒ ද්‍රව්‍යය තහනම් කිරීමේ දී එය අයිතිව තිබූ තැනැත්තාට වන්දියක් නොගෙවා ඒ ද්‍රව්‍යය විනාශ කළ හැකි යි.

(viii) සභාපතිවරයාගේ අවසරය ලියවිල්ලකින් ලබානොගෙන තමන්ට දී ඇති වෙළඳ ස්ථානයේ ආසන්නයේ හෝ ඉඩ ප්‍රමාණයේ යම් කොටසක් කොටු කිරීම හෝ යම් තිරයක් ඇදීම හෝ වහලක් ඉදිකිරීම නැතහොත් යම් තාවකාලික හෝ ස්ථිර වෙනසක් කිරීම ඒ වෙළඳ ස්ථානයේ, ආසන්නයේ හෝ ඉඩ ප්‍රමාණයේ නොකල යුතු ය.

(ix) සභාවට අයත් දේපලක් නොවන කිසිම පෙට්ටියක් මේසයක් පුටුවක් හෝ එවැනි භාණ්ඩයක් සභාපතිවරයාගේ අවසරය නොමැතිව තමාගේ වෙළඳ ස්ථානයට ආසන්නයේ හෝ වෙළඳ ස්ථානයට ගෙන ඒම හෝ එහි තබා ගැනීම මෙන්ම ඒ වෙළඳ ස්ථානයේ හෝ වෙළඳ ස්ථානය ආසන්නයේ යම් මඩු සෑදීම හෝ වෙනත් උපකරණ සවිකිරීම නොකළ යුතු ය.

31. සතිපොළ පරිශ්‍රයෙහි පොදු පරිභෝජනය සඳහා යොදවා ඇති කිසියම් විදුලි පරිපථයකින් හෝ පොදු ජල කරාමයකින් කවර හෝ වෙළඳ ස්ථානයකට විදුලි සැපයුමක් හෝ ජල සැපයුමක් ලබා ගැනීම හෝ එසේ ලබාගැනීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

32. සති පොළෙහි වෙළඳ ස්ථාන පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අවශ්‍ය කරන යම් තැනැත්තන්ට අවසර පත්‍ර නිකුත් කිරීමට හා එකී අවසර පත්‍ර සඳහා මුදල් අය කිරීමටත් ලේකම්වරයාගේ බලයලත් යම් නිලධාරියෙකු යොදවනු ලැබිය හැකි ය. එසේම යම් බලයලත් නිලධාරියෙකු විසින් අවසර පත්‍රය නිකුත් කිරීමෙන් දිනපතා එකතු කරනු ලබන මුදල් එදින පස්වරු 3.00 පැයට පෙර දූරණියගල ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලට බැර කිරීමට සැලැස්වීම එකී බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය. කිසියම් දිනයක එකී බලයලත් නිලධාරියා විසින් එකතු කරනු ලැබූ මුදල් දූරණියගල ප්‍රාදේශීය සභාවේ අරමුදලට බැර කිරීමට නොහැකි වුවහොත් සති පොළෙහි අවසර පත්‍රය නිකුත් කිරීමෙන් එකතු කරනු ලැබූ යම් මුදලක් වේ නම් එය අනුගාමී වැඩ කරන දිනයේ දූරණියගල ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලට බැර කිරීම කළ යුතු ය.

33. සති පොළෙහි කඩ කාමර සහ වෙළඳ මැහි පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට යම් තැනැත්තන්ට අවසර පත්‍ර නිකුත් කිරීම සහ ඒ සඳහා මුදල් එකතු කිරීම, 32 වන අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයෙන් ලේකම්වරයාගෙන් බලයලත් යම් නිලධාරියෙකු යෙදවීමට නොහැකි වන්නේ නම් එකී කාර්යය ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම මගින් තෝරා ගනු ලබන (මෙහි මින් මතු "ගාස්තු අය කරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකුට පැවරීමට දූරණියගල ප්‍රාදේශීය සභාවට බලය තිබිය යුතු ය.

34. 33 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ තෝරා ගනු ලැබූ කිසියම් ගාස්තු එකතු කරන්නෙකුට එකී කාර්යය පැවරීම එක් වර්ෂයක් සඳහා පමණක් වලංගු විය යුතු අතර, අනුගාමී වර්ෂය සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් මගින් ගාස්තු එකතු කරන්නෙකු තෝරා ගත යුතු ය. එසේ වුව ද කලින් වර්ෂය සඳහා තෝරා ගනු ලැබූ කිසියම් ගාස්තු එකතු කරන්නෙකුට අනුගාමී වර්ෂය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කිරීමටත් සහ එකී ටෙන්ඩර් අයදුම්පත්‍රය පිළිගැනීමට සභාව තීරණය කරන්නේ නම් ඔහු අනුගාමී වර්ෂය සඳහා ගාස්තු එකතු කරන්නා වශයෙන් තෝරා ගැනීමටත් මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් මගින් වළක්වා ඇති ලෙස තේරුම් නොගත යුතු ය.

35. (i) 33 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ ගාස්තු එකතු කරන්නෙකු තෝරා ගනු ලබන විට ඔහු විසින් -

*(අ)* එකී තෝරාගැනීම සඳහා ටෙන්ඩර් කැඳවන අවස්ථාව වන විට දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබ ඇති වටිනාකමින් යුතු හා ආපසු ගෙවන හා ආපසු නොගෙවන ඇප තැන්පත් මුදලක් දූරණියගල ප්‍රාදේශීය සභාවේ තැන්පත් කිරීමට,

*(ආ)* එකී අවසර පත්‍ර නිකුත් කිරීම හා ගාස්තු එකතු කිරීම පිළිබඳව දූරණියගල ප්‍රාදේශීය සභාව සමග ගිවිසුමකට එළැඹීමට,

*(ඇ)* *(ආ)* වැනි ඡේදයේ නියමය යටතේ අත්සන් කරනු ලැබූ ගිවිසුමෙන් එකඟ වී ඇති මාසික කුලී මුදල මෙන් මාස 03 කුලී මුදලට සමාන මුදලක් ආරක්ෂක ඇප තැන්පතුවක් ලෙස සභාවේ තැන්පත් කිරීමට ක්‍රියා කළ යුතු ය.

(ii) 35 (i) ඡේදයේ සඳහන් නියමයන් ඒ ආකාරයෙන් ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකුට දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් සති පොළක වෙළඳ ස්ථාන පාවිච්චි කරන තැනැත්තන්ට අවසර පත් නිකුත් කිරීමට හා ඒ අවසර පත් වෙනුවෙන් මුදල් එකතු කිරීමට ඉඩ දීම නොකළ යුතු ය.

36. 22 වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ කිසියම් සති පොළක වෙළඳ ස්ථාන පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබ ඇති ගාස්තුව ඉක්ම වූ ප්‍රමාණයක ගාස්තුවක් හෝ ගාස්තු අය කිරීම කවර හෝ ගාස්තු එකතු කරන්නෙකු විසින් නොකළ යුතු ය.

37. 35 වන අතුරු ව්‍යවස්ථාවේ (1) ඡේදයේ (ආ) වන අනුඡේදයේ නියමයට අනුව කිසියම් ගාස්තු එකතු කරන්නෙකු සමග දූරණියගල ප්‍රාදේශීය සභාව අත්සන් කරනු ලබන ගිවිසුමෙහි -

(i) වෙළඳ ස්ථාන පාවිච්චි කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කළ යුතු ආකාරය,
(ii) එකී අවසර පත්‍ර සඳහා මුදල් අයකරන ආකාරය සහ අය කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය,
(iii) ගාස්තු එකතු කරන්නා විසින්, ගිවිසගන්නා වර්ෂය වෙනුවෙන් දූරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු සම්පූර්ණ මුදල,
(iv) එකී වාර්ෂික මුදල සමාන වාරික දොළහකින් දූරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව සහ එක වාරිකයක වටිනාකම,
(v) එක් එක් මාසය වෙනුවෙන් ගෙවිය යුතු මුදල දූරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු දිනය,
(vi) නියමිත දිනයේ දී මාසික මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් එකී මුදලේ ප්‍රමාණයෙන් සියයට දහයක ප්‍රමාණයකට සමාන මුදලක් ප්‍රමාද ගාස්තුවක් වශයෙන් දූරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවීමට එකතු කරන්නා යටත් වන බව,
(vii) ගිවිසුම්ගත වන අවස්ථාවේ දී අවසර පත්‍ර ගාස්තු අයකරන්නා විසින් තුන් මාසික කුලී මුදලට සමාන ආරක්ෂක ඇපතැන්පත් මුදලක් දූරණියගල ප්‍රාදේශීය සභාවේ තැන්පත් කළ යුතු බව,

ගිවිසගත කොන්දේසි වශයෙන් ඇතුළත් කිරීම දූරණියගල ප්‍රාදේශීය සභාවේ කාර්යය වන්නේ ය.

38. (i) ගාස්තු එකතු කරන්නා විසින් දූරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වන මාසික ගාස්තුව නොගෙවා පැහැර හැර ඇති හා එකී හිඟ ගාස්තුව මාස දෙකක ගාස්තුවට වඩා වැඩි වන යම් අවස්ථාවක, එකී හිඟ මුදල සහ ප්‍රමාද ගාස්තුව ගෙවන ලෙස ගාස්තු එකතු කරන්නාට ලියවිල්ලකින් වන දැන්වීමක් භාර දීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(ii) 38 (i) ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ ගාස්තු එකතු කරන්නෙකු විසින් තමාට ඒ දැන්වීම ලැබුණු දින සිට දින හතක් ඇතුළත එකී හිඟ මුදල සහ ප්‍රමාද ගාස්තුව දූරණියගල ප්‍රාදේශීය සභාවට ගෙවීමට අපොහොසත් වන්නේ නම්, එකී දැන්වීම ඔහුට ලැබුණු දිනෙන් දින හතක් ඉකුත් වූ දින සිට එකී ගාස්තු එකතු කරන්නා සමග දූරණියගල ප්‍රාදේශීය සභාව අත්සන් කළ ගිවිසුම අවලංගු වීම නිත්‍යානුකූල වන්නේ ය. එසේම එකී ගිවිසුම අවලංගු වූ ලෙස සැලකෙන දිනයේ ම එකී ගාස්තු එකතු කරන්නා වෙත ඒ බව ලියවිල්ලකින් දන්වා යැවීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(iii) 38 (ii) ඡේදයේ නියමයන් යටතේ කිසියම් ගිවිසුමක් අවලංගු වූ දිනයෙන් පසුව කවර හෝ අවස්ථාවක එකී ගිවිසුමේ පාර්ශවකරුවෙකු වන ගාස්තු එකතු කරන්නා විසින් එකී සති පොළෙහි වෙළඳ ස්ථාන පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට කවර හෝ තැනැත්තෙකුට අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබීම හෝ එකී අවසර පතක් නිකුත් කිරීම වෙනුවෙන් මුදල් එකතු කරනු ලැබීම නොකළ යුතු ය.

(iv) 38 (ii) ඡේදයේ නියමයන් යටතේ කිසියම් ගිවිසුමක් අවලංගු වූ දිනයෙන් පසුව එළැඹෙන දිනයේ සිට එකී සති පොළෙහි වෙළඳ ස්ථාන හා පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අවසර පත්‍ර නිකුත් කරනු ලැබීමට සහ එකී අවසර පත්‍ර වෙනුවෙන් මුදල් එකතු කරනු ලැබීමටත් දූරණියගල ප්‍රාදේශීය සභාවේ කිසියම් බලයලත් නිලධාරියෙකු යෙදීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය. එසේම බලයලත් නිලධාරියෙකු ලවා එකී කාර්යය තවදුරටත් කරගෙන යාමට නොහැකි වන බව ලේකම්වරයාගේ මතය වන විට 34 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයන් අනුව ක්‍රියා කිරීම සඳහා තමාගේ මතය සභාපතිවරයා මගින් දූරණියගල ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු ය. ඒ ආකාරයෙන් ලේකම්වරයාගේ මතය සභාව වෙත වාර්තා වී ඇති අවස්ථාවක දී 34 වන අතුරු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කිරීමට දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ය. එසේ නොවන්නේ නම් සභාවේ සභාපතිවරයා විසින් බලය දෙනු ලබන නිලධාරියෙකු විසින් සති පොළ වෙළඳ ස්ථානයන්හි වෙළඳ කාර්යයේ නිරත වන්නන්ගෙන් අවසර පත්‍ර සඳහා ගාස්තු අයකිරීම නිත්‍යානුකූල වන්නේ ය.

39. කිසියම සති පොළක් පවත්වනු ලබන දිනයන් සහ වේලාවන් කවරේ ද යන්න භාෂාත්‍රයෙන්ම වූ දැන්වීමක් හෝ දැන්වීම ප්‍රකටව පෙනෙන ආකාරයෙන් එකී සති පොළට ඇතුල්වීමේ දෙරටුව අසල ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීමට කටයුතු සිදු කළ යුතු ය.

40. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් සති පොළක විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ගබඩා කර ඇති කිසියම් ආහාර ද්‍රව්‍යයකින් සාම්පලයක් එහි මිල ගෙවා ලබා ගැනීම නීත්‍යානුකූල විය යුතුවාක් හැර කවර හෝ තැනැත්තෙකු විසින් එකී මිලදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

41. මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල නියමයන් පරීක්ෂා කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියෙකුට පරීක්ෂා කිරීමට බලය ලැබෙන නිසි කාලය යන්නට කිසියම් සති පොළක් වෙළෙඳාම් කටයුතු සඳහා විවෘත කර තබනු ලබන ඕනෑම අවස්ථාවක් අදහස් වේ.

42. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් ඕනෑම වගන්තියක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, කිසියම් තැනැත්තෙකු නිසි අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තිය අනුව නියම කර ඇති දඩයකින් ද වරදකරු කරනු ලැබීමකින් පසුව ද එම වරද දිගින් දිගටම කරගෙන යනු ලබයි නම් එකී කඩ කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන්

පසුව ද ඒ වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වගන්තිය අනුව නියම කර ඇති අතිරේක දඩයකට යටත් විය යුතු ය.

43. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවල -

(අ) "සති පොළ" යන්නෙන් වෙළෙඳාමක නියුක්ත වීම සඳහා ඉදිකළ වෙළෙඳ පරිශ්‍ර හා තම තමන්ගේ ගෙවත්තේ හෝ නිවසෙහි නිෂ්පාදනය කරනු ලබන එළවළු හෝ පළතුරු ද ඇතුලු වෙනත් ද්‍රව්‍ය හෝ භාණ්ඩ විකිණීමට ස්ථාන ඇතිකර තිබෙන්නා වූ ද, දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් ඉදිකර පවත්වාගෙන යනු ලබන කිසියම් ස්ථානයක් අදහස් වන අතර කිසියම් නිෂ්පාදනයක් තොග වශයෙන් මිල දී ගැනීම හෝ විකිණීම කරනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

(ආ) "ගිවිසුම්කරු" යන්නෙන් දූරණියගල ප්‍රාදේශීය සභාව සමග ඇතිකර ගත් ගිවිසුමක් සහිතව කිසියම් සති පොළක යම් වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යනු ලබන තැනැත්තෙකු අදහස් විය යුතු ය.

(ඉ) "වෙළෙඳ ස්ථානය" යන්නෙන් කිසියම් සති පොළක ගොඩනැගිලි තුළ පොළව මත ඉරි සලකුණු ඇඳීමෙන් වෙළඳාම් කටයුතු සඳහා වෙන් කරනු ලැබූ ඇති කවර හෝ ස්ථානයක් ද ඊට ඇතුළත් විය යුතු ය.

**සති පොළ වෙළඳ අයිතිය බදු දීම සඳහා ගිවිසුම් පත්‍රයයි**

එක් පාර්ශවයකට (මෙහි මින්මතු) සභාපතිතුමා යනුවෙන් හඳුන්වනු ලබන දූරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපති............................................සහ මෙහි මින්මතු ලේකම් යනුවෙන් හඳුන්වන දූරණියගල ප්‍රාදේශීය සභාවේ ලේකම්...............................................යන අය ද ඇතුලු දූරණියගල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් පෙනී සිටින්නා වූ හා ක්‍රියා කරන්නා වූ දූරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපති හා ලේකම් ද අනිත් පාර්ශ්වයට මෙහි මින් මතු ගිවිසුම්කරු යනුවෙන් සඳහන් වන...............................පදිංචි.................................................................යන අය අතර, වර්ෂ....................ක් වූ.................මස.........................දී දූරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ඇති කරගත් ගිවිසුම් පත්‍රයයි.

දූරණියගල ප්‍රාදේශීය සභාවට අයත්.........................................................................පිහිටි සති පොළෙහි අංක................................දරන වෙළඳ ස්ථානය .............................වෙළඳම පවත්වාගෙන යාම සඳහා යථෝක්ත වෙළඳ ස්ථානය පාවිච්චි කිරීමේ අයිතිය මින් මතු සවිස්තරාත්මකව දැක්වෙන කොන්දේසිවලට යටත්ව ගිවිසුම්කරුට පවරා දීමට දූරණියගල ප්‍රාදේශීය සභාව එකඟ වේ. මින් මතු වඩාත් විස්තරව දැක්වෙන සහ නියම කරනු ලබන අණ පනත්වලට හා කොන්දේසි වලට යටත් ව ගිවිසුම්කරු වන........................................................................විසින් වෙළඳ ස්ථානය දීමනාකරු වන දූරණියගල ප්‍රාදේශීය සභාව සමග මෙම ගිවිසුමට අත්සන් කරනු ලබයි.

ගිවිසුම්කාර පක්ෂය විසින් වෙළඳ ස්ථානය දීමනාකාර පක්ෂය වන දූරණියගල ප්‍රාදේශීය සභාවට ශ්‍රී ලංකාවේ භාවිතා වන වලංගු මුදලින් රු.............................මුදලක් ගිවිසුම්කාර පක්ෂය විසින් වෙළඳ ස්ථානය දීමනාකාර පක්ෂයට ගෙවිය යුතු ය. දූරණියගල ප්‍රාදේශීය සභාවට අදළ කොන්දේසි අණ පනත් නීති රීති, අතුරු ව්‍යවස්ථාවලට සහ ප්‍රාදේශීය සභාව විසින් වරින් වර ගනු ලබන සභා තීරණයන්ට යටත්ව ස්වකීය වෙළඳ ව්‍යාපාරය කරගෙන යාමේ අයිතිය .......................... වර්ෂයේ ....................... මස ................... දින සිට .................... වර්ෂයේ ....................මස ................. දින දක්වා වර්ෂයක කාලයක් භුක්ති විඳීම පිණිස ගිවිසුම්කාර පක්ෂයට හිමි වන්නේ ය. වෙළඳ ස්ථානය ගිවිසුම්කාර දෙපාර්ශවය විසින් ඔවුනොවුන් අතරේ පිළිපැදිය යුතු ගිවිසුම් හා වගකීම් ද, මින්මතු දක්වෙන ආකාරයෙන් පොරොන්දු වී පිළිගන්නා ලදුව මෙම ගිවිසුමට බැඳෙන ලදී.

***කොන්දේසි***

01. දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන සැලැස්මකට අනුව සතිපොළ වෙළඳ ස්ථානය වර්ග කිරීම සහ සිදු කරනු ලබන අංක කරණයට අනුව ගිවිසුම් ගත පාර්ශ්වය වන .......................................................................වන මම මෙම අංක.................දරන වෙළඳ ස්ථානයේ වෙළඳ කටයුතු 20...............දින සිට.........................දින දක්වා පවත්වාගෙන යාම සඳහා එකඟ වෙමි.

02. ......................මස ................... දින සිට ................වර්ෂයේ .................. මස ................. දින දක්වා සති පොළෙහි වෙළඳ ස්ථානය සඳහා ස්ථාන වෙන්කර දීම වෙනුවෙන් ආපසු නොගෙවන රු................. මුදලක් දීමනාකරු වන දූරණියගල ප්‍රාදේශීය සභාව වෙත ගෙවීමට ගිවිසුම්කාර පර්ශ්වය වශයෙන් ................................................................................... වන මම එකඟ වෙමි.

03. මෙම අංක..................දරන වෙළඳ ස්ථානය සඳහා ගෙවිය යුතු දෛනික ටිකට්පත් ගාස්තුව මෙම ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කිරීම හේතුකොට ගෙන දූරණියගල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල යටතේ අවලංගු කරනු ලැබුව හොත් හෝ ගිවිසුම්කරු විසින් සිය කැමැත්තෙන් අවලංගු කරගන්නා තුරු සති පොළ වෙළඳ කටයුතුවල නිරත වන සෑම දිනයක් සඳහා ම රු.......................මුදලක් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු ය.

04. වසරකට වරක් හෝ අවශ්‍යයැයි ප්‍රාදේශීය සභාව අදහස් කරන වෙනත් ඕනෑම අවස්ථාවක දෛනික ටිකට්පත් ගාස්තුව හා ආපසු නොගෙවන එකවර ගෙවන වෙළඳ ස්ථාන වෙන්කර දීමේ ගාස්තුව ප්‍රතිශෝධන කිරීමට දූරණියගල ප්‍රාදේශීය සභාවට බලය ඇත. දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන දින සිට එසේ ප්‍රතිශෝධනය කරනු ලබන දෛනික ටිකට්පත් ගාස්තු ගෙවීම සඳහා ගිවිසුම්ගත පාර්ශ්වය එකඟ වේ.

05. වෙළඳාමේ නිරත වන දිනක දී ටිකට්පත් ගාස්තුව නොගෙවා වෙන්කර දී ඇති වෙළඳ ස්ථානයේ වෙළඳ කාර්යයේ නිරත වන ඕනෑම අයෙකු වෙළඳ ස්ථානයෙන් නෙරපා දැමීමට දැරණියගල ප්‍රාදේශීය සභාව ක්‍රියාකරනු ලැබේ.

06. ගිවිසුම්කරුට මෙම කඩකාමරය තුළ කරගෙන යාමට අවසර දී ඇති යම් වෙළඳාමක් හෝ වෙළඳ කටයුත්තක් හෝ වෙළඳ ව්‍යාපාරයක් හැර වෙනත් කටයුත්තක් ගිවිසුම්කරු විසින් පවත්වාගෙන යාම නොකළ යුතු ය.

07. ගිවිසුම්ගත පාර්ශ්වකරුට අවශ්‍ය වන්නේ නම් ලිත් මාසයක් කල් දීමෙන් පසු ගිවිසුම අවලංගු කරවා ගැනීමට හැකි අතර එසේ ගිවිසුම අවලංගු කිරීමක දී ගිවිසුම අවලංගු කරන්නා අවස්ථාව දක්වා සභාව වෙත ගෙවීම කර ඇති කිසිදු මුදලක් ආපසු ඉල්ලා සිටීමේ අයිතිවාසිකමක් ගිවිසුම්ගත පක්ෂයට නොමැත්තේ ය. වෙළඳ ස්ථානය වෙන්කර ගැනීමේ දී එකවර තැන්පත් කළ මුදල ගිවිසුම අවලංගු කිරීමේ කාර්යය සඳහා කවර හෝ අවහිරතාවයක් හෝ බලපෑමක් සිදු නොවිය යුතු අතර, එවැනි අවලංගු කිරීමක දී ගිවිසුම්කරු විසින් ගෙවා ඇති මුදල් ආපසු ගෙවන ලෙස ඉල්ලා සිටීමට ගිවිසුම්කරුට අයිතියක් නොමැත.

08. ගිවිසුම්කරු ඔහුගේ නියෝජිතයා හෝ සේවකයා විසින් ඕනෑකමින් හෝ ස්වකීය පැහැර හැරීමක් හෝ නොසැලකිළිමත්භාවයක් හේතු කොට ගෙන තමා ගිවිසුම්ගතව වෙන්කරගෙන ඇති වෙළඳ ස්ථානය තුළ හෝ ගිවිසුම්ගත පාර්ශ්වකරුවන්ගේ පාවිච්චිය සඳහා වෙළඳ ස්ථානවලින් පිටත පොදු වෙළඳපළේ සවිකර ඇති විදුලි, ජල, උපකරණ, පිරිදුම් වානේ දැල්, දොර, ජනෙල්, ගේට්ටු යනාදී ප්‍රාදේශීය සභාව සතු දේපළකට අලාභ හානියක් සිදුනොකළ යුතු ය. තව ද, ගිවිසුම්කරුගේ ගිවිසුම අවලංගු වීමක දී ගිවිසුම්කරු විසින් සපයා තබාගෙන සිටි උපකරණ සියල්ල ඉවත් කර ගෙන යාමේ දී සභාවේ යම් දේපළකට අලාභ හානියක් සිදු නොකළ යුතු ය. තව ද ගිවිසුම්කරුගේ ගිවිසුම අවසන් වීමක දී ගිවිසුම්කරු විසින් සපයා ගෙන සිටි උපකරණ ඉවත් කරගෙන යාමේ දී සභාවේ යම් දේපළකට නොසැළකිලිමත්කම හේතු කොටගෙන කවර හෝ ආකාරයක යම් අලාභයක් සිදු වීමට අවකාශ නොතිබිය යුතු ය. එවැනි හානියක් සිදු කරනු ලැබුවහොත් දූරණියගල ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් විසින් එම හානිය සම්බන්ධයෙන් දෙනු ලබන තක්සේරු වටිනාකම දූරණියගල ප්‍රාදේශීය සභාව ගෙවනු ලබන ලෙස නියම කරනු ලැබූ වහාම බදුකරු විසින් ගෙවිය යුතු වේ. ගිවිසුම්කරු සතු භාණ්ඩ හෝ උපකරණ වලට සිදු වන කුමන අන්දමේ හෝ අලාභහානියක් සඳහා සභාව වග කියනු නොලැබේ.

09. ගිවිසුම්කරු වෙළඳ ස්ථානයෙහි යම් කොටසක භුක්තිය අන්‍යයෙකුට විකිණීම පැවරීම හා අතුරුබදු වශයෙන් දීම හෝ සභාවේ අවසරයක් නොමැතිව එයින් ඉවත් වීම නොකළ යුතු ය. ගිවිසුම්කරු විසින් වෙළඳ ස්ථානයේ පවත්වාගෙන යනු ලබන වෙළඳාම හෝ ඉන් කොටසක් විකිණීම, මාරු කිරීම හවුල් ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීම හෝ උකස් කිරීම නොකළ යුතු ය.

10. සභාපති හෝ ඔහුගේ බලයලත් නිලධාරීන්ට හා සේවකයන් ට වෙළඳස්ථානයට ඇතුල්වීමට ගිවිසුම්කරු විසින් ඉඩදිය යුතු අතර, ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් ද ගිවිසුම්කරු විසින් ඔවුන්ට සලසා දිය යුතු ය.

11. ගිවිසුම්කරු විසින් මෙම වෙළඳ ස්ථානයේ හෝ පොදු වෙළඳපළේ කිසියම් කොටසක් නිර්මාණාත්මක හෝ වෙනත් ආකාරයක වෙනස් කිරීමක් කවර අන්දමකින් හෝ නොකළ යුතු අතර සභාපතිතුමාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා නොගෙන ගිවිසුම්කරු විසින් ස්ථිර හෝ තාවකාලික සවි කිරීම හා පිරිද්දුම් ආදියත් සවි කිරීම හෝ ස්ථාපනය කිරීම නොකළ යුතු ය.

12. වෙළඳ ස්ථානය පිරිසිදුවත් සනීපාරක්ෂාවට හිතකර අන්දමටත් සවි කිරීම සඳහා අවශ්‍යයයි දූරණියගල ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් විසින් කල්පනා කරනු ලබන සියලුම ආකාරයේ උපකරණ ද, බඳුන් ද ගිවිසුම්කරු විසින් තමාගේ වෙළඳ පරිශ්‍රය තුළ සපයා තිබිය යුතු ය.

13. ගිවිසුම්කරු විසින් ජලාපවහන ක්‍රමයට හෝ කසළ කානු වලට බාධා ඇතිවන අයුරු හෝ ඒවායේ ක්‍රියාකාරිත්වයට කානු වලට හෝ බේසම් වලට හෝ අනෙකුත් භාජනවලට හෝ ජලාපවහන ක්‍රමයට යම් කිසි ද්‍රව්‍යයක් හෝ යම් කිසිවක් විසිකිරීම හෝ හැලීමට සැලැස්වීම නොකළ යුතු ය.

14. කැළි කසළ හෝ අමතර ද්‍රව්‍ය ඒවා දැමීමට නියම ස්ථානයේ මිස විසි කර දැමීම හෝ තැන්පත් කිරීම නොකළ යුතු ය.

15. යම් කිසි වෙළඳ ස්ථානයක ඇතුල් පැත්තෙන් හෝ පිට පැත්තෙන් හෝ බිත්තිවල කානු වල ප්‍රචාරක දැන්වීම්, දැන්වීම් පත්‍රිකා ඇලවීම හෝ සවි කිරීම හෝ නොකළ යුතු ය. යම් කිසි වෙළඳාමක හෝ ව්‍යාපාරයකට අදාල යම් සංඥා නාම පුවරු හෝ වෙනත් ප්‍රදර්ශන පුවරු වෙතොත් දූරණියගල ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් අනුමත කරනු ලබන ස්ථානවල සහ අනුමත කරන ආකාරයට පමණක් ඒවා අලවා ප්‍රදර්ශනය කළ යුතු ය.

16. ගිවිසුම්කරු විසින් යම් කිසි උපකරණ හෝ භාණ්ඩ ආදිය තම වෙළඳ ස්ථානයේ වහළය මත නොතිබිය යුතු ය.

17. යම් වෙළඳ ස්ථානයක සීමාවෙන් පිටතට යන පරිදි කුමන ස්වභාවයක හෝ ද්‍රව්‍ය හෝ උපකරණ ගොඩගැසීම හෝ තැන්පත් කිරීම නොකළ යුතු ය. වාහන වලින් ප්‍රවාහනය කරනු ලබන බඩු උපකරණ හෝ ද්‍රව්‍ය වෙළඳ ස්ථානය වෙත අප්‍රමාදව රැගෙන යා යුතු ය.

18. යුක්ති සහගතව අවශ්‍ය වන කාලසීමාවට වැඩිමනත් කාලයක් වෙළඳ ස්ථානයකට භාණ්ඩ හෝ ද්‍රව්‍ය ප්‍රවාහනය කරන වාහන සති පොළ වෙළඳ සැළ භූමියේ නවතා තැබීම හෝ නවතා තැබීමට ඉඩ හැරීම නොකළ යුතු ය.

19. සති පොළ පැවැත්වෙන දිනට පෙර දින ප. ව. 3.00 සිට සති පොළ පැවැත්වෙන දිනට පසු දින පෙ. ව. 9.00 දක්වා පොළ පරිශ්‍රය විවෘත කර තබනු ලබන අතර එකී වෙලාව තුළ හැර වෙනත් වෙලාවන් තුළ ගිවිසුම්කරුවන්ට ඔවුන්ගේ සේවකයින් කිසිවකුට වෙළඳ ස්ථානයේ හෝ වෙළඳ පරිශ්‍ර ගොඩනැගිල්ලේ රැඳී සිටීමට අයිතිය නැත.

20. ගිවිසුම්කරු හා/හෝ ඔහුගේ සේවකයකු කිසියම් අහිතකර හා බෝවන රෝගයකින් පෙළෙන්නේ යැයි සැක කරන විට තිසි වෛද්‍ය පරීක්ෂණයක් සඳහා තම ඉදිරිපත් වීම හෝ එම සේවකයා ඉදිරිපත් කිරීම කළ යුතු අතර සභාවේ බලයලත් නිලධාරියෙකු විසින් වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙනු ලැබූ විට වහාම එකී ලියවිලි ඉදිරිපත් කළ යුතු වේ. ගිවිසුම්කරු බෝවන රෝගයකින් හෝ අහිතකර රෝගයකින් පෙළෙන විට වෙළඳ ස්ථානයේ මොනයම් කටයුත්තකටවත් සහභාගි නොවිය යුතු අතර එවැනි රෝගයකින් පෙළෙන සේවකයෙකු ද සේවයේ යොදවා ගැනීම නොකළ යුතු ය.

21. සතිපොළ කඩ කාමරය තුළ මත්ද්‍රව්‍ය හෝ මත්පැන් වැනි ද්‍රව්‍යයන් විකිණීම හෝ එවැනි ද්‍රව්‍යයන් පානය හෝ රජයේ සම්මත නීති රීති වලින් තහනම් යම් කටයුත්තක් හෝ ඒ සඳහා කිසිම කෙනෙකුට ඉඩදීම හෝ තම කඩ කාමරය තුළ බීමත්ව හැසිරීම සූදු ක්‍රීඩා වැනි දේ නොකළ යුතු අතර එවැනි ක්‍රියා කඩ කාමරය තුළ කිරීමට කිසිවෙකුට ඉඩ නොදිය යුතු ය. තව ද, මෙම කඩ කාමරය තුළ නීති විරෝධී ක්‍රියාවන් කිරීමට කිසි කෙනෙකුට ඉඩ නොදිය යුතු ය.

22. ගිවිසුම්කරු ඔහුගේ නියෝජිතයන් හා සේවකයන් විසින් මෙම පොරොන්දු පත්‍රයේ අන්තර්ගත කොන්දේසි ද දූරණියගල ප්‍රාදේශීය සභාව විසින් පනවා ඇති පොදු සති පොළ පිළිබඳ අතුරු ව්‍යවස්ථා හා ඉදිරියේ දී පවත්වනු ලබන අතුරු ව්‍යවස්ථා වෙතොත් වෙනත් අණ පනත් වලින් නියම කරන විධිවිධාන කඩ නොකළ යුතු අතර එකී කවර විධිවිධානයක් හෝ කඩකරනු ලැබුවහොත් එය මෙම ගිවිසුම අවලංගු කර බදුකරුගේ බදු අයිතිය ද අහෝසි කර මෙම වෙළඳ ස්ථානය පවරා ගැනීමට හේතු වනු ඇත.

23. මෙම කඩ කාමරයට අදාළව ගිවිසුම ක්‍රියාත්මකව පවතින අතරතුර කාලයේ දී බදු ගැනුම්කරු මිය ගිය හොත් මෙකී ගිවිසුම අවලංගු කිරීමේ සම්පූර්ණ බලය දූරණියගල ප්‍රාදේශීය සභාව සතු වේ. බදු ගැනුම්කරු මිය ගිය අවස්ථාවක ඔහු විසින් දූරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ තැන්පත් කර ඇති ඇප මුදලින් ප්‍රාදේශීය සභාවට කිසි මුදලක් අය වීමට ඇත්නම් එම මුදල අඩුකර ගැනීමෙන් පසුව එකී තැන්පත් මුදල් ශේෂය බදු ගැනුම්කරුගේ නීත්‍යානුකූල අද්මිනිස්කරුට පෝල්මෑකාරකරුට හෝ නීත්‍යානුකූල උරුමක්කාරයින්ට ගෙවනු ලැබේ. තැන්පත් කළ යුතු නියමිත හා අදළ ඇප මුදලින් දූරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ තැන්පත් කිරීමෙන් පසුව සහ මෙකී ගිවිසුමේ සඳහන් කොන්දේසි ක්‍රියාත්මක කරන බවට ගිවිසුම් පත්‍රයට ඇතුළත් වීමෙන් පසුව මෙම කාමරයේ වෙළඳාම පවත්වාගෙන යාම සඳහා මියගිය බදු කරුගේ ස්වාමිපුරුෂයා/භාර්යාව/දරුවෙකු මගින් ඉල්ලනු ලැබුවහොත් ඔහුට හෝ ඇයට මියගිය ගැනුම්කරු වෙනුවෙන් එකී කඩකාමරයේ වෙළඳ ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවසරය හෝ බලය දීමේ සම්පූර්ණ අයිතිය දූරණියගල ප්‍රාදේශීය සභාව සතු වේ.

24. මීට අත්සන්කර ඇති පර්ශ්වකාරයන් අතර යම් මතභේදයක් හෝ විරෝධතාවයක් පැන නැගුණ හොත් එකී මත භේදයන් හෝ විරෝධතාවයන් ..................................පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුම් දිය යුතුවාක් හැර මෙහි මින්මතු සටහන් කොට ඇති ප්‍රකාරව මොනම පාර්ශ්වකාරයෙකු විසින් වුව ද ඒ පිළිබඳ බේරුම් කිරීමේ විනිශ්චයක් සඳහා ඉල්ලීම් කොට තිබේ නම් මිස නැත්නම් ඔවුන්ගේ තීරණය අවසන් තීරණය වන්නේ ය. නමුත් එම ලේකම්ගේ තීරණ යම්කිසි පර්ශ්වකරුවෙකුට දැනුම් දෙනු ලැබූ දින සිට දින 07ක් ඇතුළත දී පාර්ශ්වකාරයා විසින් ලියවිල්ලකින් එසේ ඉල්ලීම් කර සිටියහොත් එම ලේකම්වරයා විසින් මත භේදයට හේතු වූ කාරණ ගැන විභාග කොට විනිශ්චය කොට සුදුසු කෙනෙකු පත්කරනවා ඇත. 1905 අංක 11 දරන බේරුම් කිරීමේ පනත මෙම කරුණේදී අදල කරගනු ලැබේ. නීතිය පිළිබඳ වුවත්, ප්‍රස්තුත කාරණය පිළිබඳ වුවත් එකී අයගේ තීරණය නොහොත් විනිශ්චය අවසාන තීරණය නොහොත් විනිශ්චය වන්නේ ය. මීට සම්බන්ධ වූ පාර්ශ්වකාරයන් විසින් එකී තීරණය හෝ විනිශ්චය පිළිගත යුතු ය.

වර්ෂ......................................... වූ ........................................මස ................................දින එකී පාර්ශ්වය විසින් පහත සාක්ෂිකරුවන් අභිමුඛයේ දී මෙම ගිවිසුම් පත්‍රයට ඔවුන්ගේ අත්සන් තබන ලදී.

| | | |
|---|---|---|
| .................................. | ......................................... | ......................................... |
| සභාපති | ලේකම් | ගිවිසුම්කරු |
| දූරණියගල ප්‍රාදේශීය සභාව | දූරණියගල ප්‍රාදේශීය සභාව | ජා.හැ.අං............................ |

සාක්ෂි :

1. අත්සන :................................................................. ජා.හැ.අං....................................................
   නම සහ ලිපිනය:...............................................

2. අත්සන :................................................................. ජා.හැ.අං.....................................................
   නම සහ ලිපිනය :.............................................

*2 වැනි උපලේඛනය*

මුදල් අය කිරීමේ ටිකට්පත

*දැරණියගල ප්‍රාදේශීය සභාව*

**දැරණියගල ඉරිද සති පොළ වෙළඳ පරිශ්‍රයක්/වෙළඳ මැස්සක් පාවිච්චි කිරීම සඳහා වන ටිකට් පත**

නම :........................................................................................................................................................................................

(වෙළඳ පරිශ්‍රය හෝ වෙළඳ මැස්ස භාවිතා කරන්නා)

ජාතික හැඳුනුම්පත් අංකය :.........................................................................................................

වෙළඳ පරිශ්‍රයේ/වෙළඳ මැස්සේ අංකය :...............................................................................

වෙළඳාම් වර්ගය :............................................................................................................................

අයකර ගනු ලබන ගාස්තු :.........................................................................................................

.....................................
නිකුත් කළ දිනය.

.........................................................,
නිකුත් කළ නිධාරියා.

*3 වැනි උපලේඛනය*

**ගාස්තු චක්‍රය**

| *වෙළඳ ස්ථානයේ ස්වභාවය* | *දිනක ගාස්තුව* |
|---|---|
| වෙන් කරන ලද පරිශ්‍රය සඳහා (ස්ථිර කඩ කාමර සඳහා) | |
| සති පොළ සැලැස්ම අනුව කඩ කාමර අංක 01-04 දක්වා, 11-18 දක්වා, 29-97 දක්වා, 114-151 දක්වා, 182-240 දක්වා | රු. 200 00 |
| කඩ කාමර අංක 05 සිට 10 දක්වා ද, 19-28 දක්වා ද, 98-113 දක්වා ද, 152-181 දක්වා ද, 241-245 දක්වා | රු. 100 00 |
| ආපන ශාලාව | රු. 250 00 |
| **ජංගම වෙළඳාම** | |
| ජංගම වෙළඳාම (වාහන) | රු. 100 00 |
| ජංගම වෙළඳාම (පුද්ගලයින්) | රු. 30 00 |
| **පදික වෙළඳාම** | |
| මාළු ලෑලි | රු. 250 00 |
| පදික වෙළඳාම | රු. 50 00 |

02-302

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2016

බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින ආයතනවල බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 1.1 *මාසික වැටුප් පරිමාණය :*

රු. 12,470-10x130-10x145-10x160-12x170-රු. 18,860

1.2 *දීමනා :* රජය විසින් අනුමත ජීවන වියදම් දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

02. *වයස් සීමාව :* 2016.02.26 දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

03. *අධ්‍යාපන සුදුසුකම් :* දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබිය යුතු ය. (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05ක් සමත්ව තිබිය යුතු ය.)

04. *අනෙකුත් සුදුසුකම්.-*

4.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

4.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතු ය.

(ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතු ය.)

4.3 පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබීම. සී සහ සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබිය යුතු ය.

4.4 වාහන රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතු ය.)

4.5 අවම උස අඩි 05ක් විය යුතු ය.

4.6 දිවා රාත්‍රී කාලවල සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.

4.7 මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.-*

5.1 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

5.2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය.-*

මේ සමඟ ඇති ආකෘතියට අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් පිළියෙල කරගත් අයදුම්පත් 2016.02.26 හෝ එදිනට පෙර ''ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.), අංක 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාර දිය යුතු ය. ඉල්ලුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි පැහැදිලිව ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතු ය. දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ගේ අයදුම්පත්‍ර තම ආයතන ප්‍රධානීගේ නිර්දේශය ද සහිතව ඉදිරිපත් කළ යුතු ය. ප්‍රමාද වී හෝ නියමිත සුදුසුකම් සපුරා නොමැතිව හෝ අසම්පූර්ණව ඉදිරිපත් කෙරෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. තව ද, මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ ඇතුළත් කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පළිබඳව අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

එන්. නිල්වල,
ලේකම්,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග,
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ
ගොවිජන සංවර්ධන පිළිබඳ
අමාත්‍යාංශය (බ. ප.)

අංක 32,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

### ආදර්ශ අයදුම්පත්‍රය

### *බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2016*

01. i. මුලකුරු සමග නම :————.
ii. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

02. i. ස්ථිර ලිපිනය :————.
ii. රාජකාරී ලිපිනය :————.
iii. දුරකථන අංකයඃ පෞද්ගලික :————. රාජකාරී :————.

03. i. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
ii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2016.02.26 දිනට බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය :

අවු. :——, මාස :——, දින :——.

04. i. උපන් දිනය :————.
ii. 2016.02.26 දිනට වයස : අවු. :——, මාස :——, දින :——.
(සම්මුඛ පරීක්ෂණයේ දී උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතු ය.)
iii. ජා. හැ. අංකය :————.

05. *අධ්‍යාපන සුදුසුකම්.-*

(සහතික මගින් සනාථ කළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

5.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය ඃ

*වර්ෂය ඃ..................................* *විභාග අංකය ඃ.............................*

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. ........................................................ | ............................................ |
| 2 ........................................................ | ............................................ |
| 3 ........................................................ | ............................................ |
| 4 ........................................................ | ............................................ |
| 5 ........................................................ | ............................................ |
| 6 ........................................................ | ............................................ |
| 7 ........................................................ | ............................................ |
| 8 ........................................................ | ............................................ |

06. 2016.02.26 දිනට පළපුරුද්ද ඃ අවු. :———, මාස :———, දින :———.

(සහතික මගින් සනාථ කළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

...................................................................................වන මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි මා විසින් සපයන ලද තොරතුරු අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෙලිවුවහොත් එසේ සාවද්‍ය බව හෙළි වූයේ තෝරා ගැනීමට පෙර නම් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි. තව ද, ප්‍රායෝගික පරීක්ෂණයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීති රීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.................................. ..................................................,
දිනය. අයදුම්කරුගේ අත්සන.

07. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ

..................................................................මයා/මිය/මෙය මෙම දෙපාර්තමේන්තුවේ ........................................................වශයෙන් .......................දින සිට සේවය කරන බවත්, පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත්, පූර්වාසන්න වසර 02 තුළ වැටුප් රහිත නිවාඩු ලබාඇති/නැති බවත් අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් සහතික කරමි.

.................................. ..............................................................................
දිනය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

02-264

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.